# අභිධර්මය නොවන අභිධර්මය

බෙල්ලන්විල ධම්මානන්ද හිමි

# අභිධර්මය නොවන අභිධර්මය

© බෙල්ලන්විල ධම්මානන්ද හිමි

ප්‍රථම මුද්‍රණය : 2019
දෙවන මුද්‍රණය : 2024

ISBN 978-624-93161-2-6

<u>කතෘ හිමියන්ගේ වෙනත් කෘති</u>

- සම්මා සතිය නිරවුල්ව
- මුල් බුදුසමය සොයාගත්තෙමි
- වේදනානුපස්සනාව
- ක්ෂණ භංග දැකීම, ථේරවාදය හා විපස්සනාව

**වළගම්බා සෙනසුන**
ඊරියාව
අඹන්පොළ
කුරුණෑගල
දුරකථන :- 0713808220 valagamba.net

මුද්‍රණය:

SRIDEVI

**ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්**
27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන : 0112716709

# පූර්විකාව

බුදු කෙනෙකුන් ලොව පහල වීම අතිශයින් දුර්ලභය. ලෝවැසියන්ට උතුම් දහම් මඟ විවෘත වනුයේ එකල්හීය. සාමාන්‍ය මට්ටමේ සිට ක්‍රමයෙන් ගැඹුරට පමුණුවන නිර්මල ප්‍රතිපදාව සර්වඥතා ඥානයෙන් මිස අන් අයුරකින් මතුකළ නොහැකිය. මනාව දේශිත එම ප්‍රතිපදාවේ යෙදෙන්නාට තමා සිටින්නේ කොතනද, යායුත්තේ කොතනටද, කොතරම් දුරක් ගෙවා ආවේද, යන්න දහම තුලින්ම පැහැදිලි වියයුතුය. නිශ්චිත ඉලක්ක ගත වැඩපිළිවලක් පෙර හා පසු සම්බන්ධවන ප්‍රතිපදාවක් අපට ලැබුනේ සද්ධර්මය තුළින්ය. එනමුත් නොයෙකුත් සාවද්‍ය විවරණ නිසා මෙම සද්ධර්මයේ ජීවගුණය බොහෝ දෙනෙකුට මගහැරීයන බවක්ද පෙනෙන්නට තිබේ.

වසර ගණනාවකට පෙර මෑතකාලින අභිධර්මය ඔස්සේ මනසිකාරය කරනවිට, එය ඔස්සේ සිත පිළිබඳව විමසන විට අපහට එක්තරා නොගැලපීමක් නැවත නැවතත් දැනෙන්නට විය. පසුව ත්‍රිපිටකගත අභිධර්මය තුල දුටුදේ පුදුම සහගතය. අවුරුදු දහස් ගණනක් පුරාවට සිදුවූ වෙනස්කම් හේතුවෙන් නිර්මල අභිධර්මය විකෘති ලෙස ඉදිරිපත් වනබවට පැහැදිලි විය. සියළු කාරනා නොවූවත් මූලධර්ම සම්බන්ධ ගැටළු කීපයක් නිසා සමස්ත අභිධර්ම අධ්‍යයනයටම නොයෙක් අයුරින් මෙම විකෘති බලපා ඇතිබව පෙනෙන්නට විය.

ගැඹුරු දහම් අධ්‍යයනයක යෙදෙන්නන්ගේ දියුණුව වළකමින් පමාවී හෝ ජීවිතය ගැන වැටහීමක් ගෙනදීමට බාධාකරන පටලැවිලි රාශියක් අභිධර්ම ප්‍රතිරූපකව ඉදිරිපත්වන බව පැහැදිලිය. මෙම ගැටළුවේ අගමුල අභිධර්මය පිටකයේ සිට අර්ථකථා, ටීකා ඔස්සේ මෑතකාලීන නොයෙකුත් සංග්‍රහ ග්‍රන්ථ දක්වා දිවයයි. බොහෝ දෙනෙකුට මෙය පහසුවෙන් ලිහාගත නොහැකි යැයි සිතුනු බැවින් අපගේ යුතුකමක් ලෙස සළකා මෙම කෘතිය සම්පාදනයට මුලපිරුවෙමි. කෙනෙකුට විදර්ශනා භාවනාවේ මූලික අඩිතාලම් මනාව දා ගනීමට මෙම කෘතිය ඉවහල් වනු ඇතැයිද අපගේ අදහසයි.

තරමක් සංකීර්ණ එකට ඇඳුනු පටලැවිලි රාශියක් ලෙහීම පහසු නැත. දුරදිගගොස් ඇති ගැටළුවක් නිසා බොහෝ සූත්‍ර පාඨ,

අභිධර්ම පාඨ, කරුණු තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළයුතු විය. හැකිතාක් සරල කොට කරුණු ඉදිරිපත් කිරීමට උත්සාහ දැරුවද අරුත් පටලැවිය හැකිබැවින් නැවත නැවතත් කියවා බලා තේරුම් ගැනීමට උත්සාහ කළයුතුය. සමහර කාරණා තේරුම් ගනීමට පසුව දක්වා ඇති කාරණා අවශ්‍ය බැවින් සංයමයෙන් යුතුව කියවිය යුතුය.

කලක සිට අප සමග දහම් සාකච්ඡා කරමින් ගැඹුරු දහම් කරුණු ගැන විමසිලිමත් වෙමින් සමීර කුරුප්පු ගුරුමහතාත් විශාඛා ගුරුමහත්මියත් මෙවැනි කෘතියක් සම්පාදනය සම්බන්ධයෙන් අප උනන්දු කරවීය. තවද මෙවැනි කෘතියක අවශ්‍යතාවය ගැන ලසිත මලලසේකර වෛද්‍ය තුමාත් නිතර සඳහන් කරන්නට විය. සෝදුපත් බලමින් මෙම කෘතිය සම්පාදනයෙහි ලා සහාය වූ තුසිත මලලසේකර මහත්මා ඇතුළුව නන් අයුරින් සහාය දුන් මහත්ම මහත්මීන්ටත් මෙම කෘතිය මැනවින් මුද්‍රණය කරදුන් ශ්‍රී දේවී ප්‍රින්ටර්ස් ආයතනයටත් විශේෂ ස්තුතිය පිරිනමමි.

මේ සියළු දෙනාගේ නිවන් මඟ එළිපෙහෙලි වීමට මෙයින් ජනිත වූ සියලු පුණ්‍ය ශක්තිය හේතුවේවා යැයි පතමි.

**බෙල්ලන්විල ධම්මානන්ද හිමි**
වළගම්බා සේනාසනය
2019-06-12

## <u>දෙවනි මුද්‍රණය සම්බන්ධව</u>

මෙම කෘතිය මෙන්ම අප විසින් සම්පාදිත අනෙකුත් කෘතීන්ද, විදර්ශනා භාවනාවේ එකම ඉලක්කයක් උදෙසාය සම්පාදනය කරනු ලැබූයේ. විශේෂයෙන් මුල් බුදුසමය හා ක්ෂණ භංග කෘතීන් සමග මෙම කෘතියත් කෙනෙකුට එකවර පිළිගැන්විය හැකිනම් වඩාත් අගනේ යැයි අපට සිත්විය. මෙම කෘතීන් තුනම විදර්ශනාව සම්බන්ධ එක්තරා කථාවක් විවිධ කෝණයන්ගෙන් විවර කරන බැවිනි. පෙර මුද්‍රණයේ පොත් අවසන් වී තිබූ හෙයින්, මෙසේ නව මුද්‍රණයක අවශ්‍යතාවය මතුවිය. මෙවන් පසුබිමක කලෙක සිට හඳුනන චතුර ද සිල්වා මහතා, ධර්ම දානමය පිංකමකට ඉදිරිපත්ව සිටි හෙයින්, අපගේ සිතැඟි ඉටුකරගැනීමට හැකිවිය.

අර්ථය වඩාත් සුගම වනලෙස තැන් කිහිපයක අලුතින් කරුණු එකතු කරන ලදී. අටුවා උදෘතයට පරිවර්තනයක්ද ඇතුලත් කෙරින.

මෙම මුද්‍රණයේ බහුතර පිටපත් ප්‍රමාණයක් ධර්ම දානයක් ලෙසින් පිරිනැමෙන අතර සීමිත පිටපත් ප්‍රමාණයක් පොත්හල් වලින් ලබාගැනීමට සලස්වා ඇත. පොතේ මුද්‍රණ දායකත්වය සඳහා පිං පැමිණවීම අවසන් පිටුවේ දක්වා ඇත.

2024-03-18

## විශේෂ සිහිපත් කිරීම.

මනුෂ්‍ය ජීවිතයක් ලබාගෙන උතුම් පැවදි ජීවිතයක් ගතකිරීමට ලැබීම අපලත් විශාල භාග්‍යයකි. එය අහම්බෙන් සිදුවූවක් නොවේ. සංඝ පීතෘවරයන් වහන්සේලාගේ උපකාරය මතය එය සිදුවූයේ. ආදර්ශය තුළින් ධර්ම දේශනයෙන් උතුම් ගුණධර්ම ගැන කියාදුන් උතුම් පැවිද්ද මා හට ලබාදුන් අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේට මෙම කෘතිය උපහාරයක්ම වේවා. පූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද හිමියන් ඇතුලුව අපගේ පැවිදි ජීවිතයට විසාල පිටිවහලක් වූ සියලු මහා සංඝරත්නයට නමස්කාර වේවා. මෙම කෘතිය ඉදිරිපත් කිරීමට මහා සංඝරත්නයේ අවසරය අපට ලැබේවා.

උතුම් පැවදි ජීවිතයට එළඹීමට අපට විශේෂ දිරියක් වුණු, ජීවිතයේ යථා ස්වභාවය ධර්මදේශනාවෙන් මනාව පෙන්වාදී වදාළ අතිපූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමිපාණන් වහන්සේද විශේෂයෙන් සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කරගනිමු. ස්වාමීන් වහන්සේගේ සියළු සම්‍යක් ප්‍රාර්ථනා ඉෂ්ට සිද්ධ වේවා. කරන්නාවූ ශාසනික මෙහෙවර බොහෝ දෙනාට හිතසුව පිණිස චිරාත් කාලයක් පවතීවා. ගැඹුරු දහම් කරුණු මතු කරදී ලෝකයාට ධර්මයේ විශේෂ පැතිකඩක් විවර කරදුන් අපවත්වී වදාළ අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමිපාණන්ද විශේෂයෙන් සිහිපත් කරමු.

# පටුන

## අන්තර්ගතය


1. අභිධර්මයේ මූලික කරුණු - 07
2. අභිධර්මය බුද්ධභාෂිතයක්ද - 08
3. අභිධර්මය ගැන විනය හා සූත්‍ර පිටකයේ සඳහන් තැන් - 08
4. නිවන් දැකීමට අභිධර්මය හැදෑරිය යුතුමද - 12
5. බුද්ධකාලීන අභිධර්මය හා පසුකාලීනව ඇතිවූ වෙනස්කම් - 17
6. පරමාර්ථ සහ සම්මුති (පඤ්ඤත්ති) - 17
7. පරමාර්ථ වචනයේ අර්ථය - 19
8. පඤ්ඤත්ති හෙවත් පැනවීම් යනු කුමක්ද - 22
9. විදර්ශනාවට බලපාන ආකාරය - 33
10. සද්ධර්ම ප්‍රතිරූපක අන්තදෙක - 41
11. පරමාණුවාදය. - 41
12. ආරම්මණ විභාගය. - 43
13. අනිත්‍ය සංඥාව යනු කුමක්ද - 52
14. විඤ්ඤාණවාදය-රූප යනු සිතේ පරිකල්පනයක්ද - 56
15. ඥානදර්ශනය පහළවූවිට රූප අහෝසි වේද? - 59
16. ඇස, කන ආදි රූප සිත සමග පහළවී සිත සමග බිඳී යයිද? - 60

# අභිධර්මය නොවන අභිධර්මය

**නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!**

සත්වයෝ එකිනෙකාට වෙනස්ය. කායිකව හා මානසිකව සත්වයෝ විවිධ වෙති. විවිධ වූ කායික මානසික ස්වභාවයන්, ඒවා හටගන්නා ආකාරය, නැතිවීයන ආකාරය, එකිනෙක අතර සම්බන්ධතා, විස්තරාත්මකව පැහැදිලි කෙරෙන දේශනය අභිධර්මයයි. අභිධර්මය යන වචනයේ අදහස සුවිශේෂි ධර්මය යනුයි. සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් පටිච්චසමුත්පාදය චතුරාර්ය සත්‍යය ගැන විවරණයන්ද අභිධර්මය ලෙස දැක්විය හැක. ගැඹුරු දහම් කරුණු පිළිබඳ විවරණ තුන් පිටකය පුරාවට දක්නට ලැබේ. බහුලවශයෙන් අභිධර්ම පිටකය තුළ ගැඹුරු දහම් කරුණු අඩංගුය.

අභිධර්ම පිටකය සූත්‍ර පිටකයට වඩා වෙනස්වන ප්‍රධාන කරුණක් ඇත. මුළු අභිධර්ම පිටකයම එක් තැනකදී එක දිගට කරනලද දේශනයකි. අභිධර්ම පිටකයේ මුලින් අර්ථ දැක්වෙන ධර්මතා පිළිබඳ නිසි අවබෝධය පසුව දැක්වෙන කරුණු තේරුම් ගැනීමට අත්‍යාවශ්‍යය. එනිසා අභිධර්ම පිටකයේ අවසාන කොටසේ කරුණක් තේරුම් ගැනීමට මුල සිටම සංයමයෙන් ක්‍රමානුකූලව අධ්‍යයනය කළයුතුය. එයට කාලයක් ගතවේ. ඉවසීමක් අධිෂ්ඨානයක් නැති කෙනෙකුට එය කළ නොහැක. සමහර විට ගුරුවරයෙකුගේ උපකාරය ද අවශ්‍යවේ. නිහතමානී ගුණයක් නැත්තෙකුට එයද කළ නොහැක.

නමුත් සමහරක් සූත්‍ර තේරුම් ගැනීමට වෙනත් සූත්‍රගැන දැනුම අත්‍යාවශ්‍ය කාරණයක් නොවේ. මේනිසා අභිධර්මාර්ථ තේරුම් ගැනීම කෙනෙකුට තරමක් දුෂ්කර විය හැක.

## අභිධර්මය බුද්ධ භාෂිතයක්ද?

බුදුරජාණන් වහන්සේ සත්වන වස් කාලයේ තව්තිසා දෙව්ලොවට වැඩම කොට අභිධර්මය දේශනා කළසේක. නාම-රූප ක්‍රියාකාරිත්වය ඉතා සංකීර්ණය සියුම්ය. දේශනා කිරීමද දුෂ්කරය. තේරුම්ගැනීමට දුෂ්කරවීම අරුමයක් නොවේ.

සූත්‍රගත දේශනාවලට අභිධර්මය ගලපාගත නොහැකි වූ සමහරෙක් අභිධර්මය බුද්ධභාෂිතයක් නොවේ යැයි කීමට පෙළඹුණහ. සූත්‍ර පිටකය පමණක් හදාරන සූත්‍ර පිටකයටම මූලිකත්වය දෙන සුත්තන්තික නැමැති නිකායක් බුද්ධපරිනිර්වාණයෙන් වසර දෙසීයක් පමණ ගියතැන බිහිව තිබූ බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වේ. ඔවුනට අනුව ඇත්තේ ත්‍රිපිටකයක් නොව පිටක දෙකක් පමණය.

තවද පසු කාලයේ දී අභිධර්මය ගැන ලියවුණු සංග්‍රහ ග්‍රන්ථ තුළින් නොයෙකුත් විකෘති කරුණු ඉදිරිපත් විය. අභිධර්මය ගැන වැරදි අදහසක් සමාජ ගතවීමට මෙම සංග්‍රහ ග්‍රන්ථ බලපෑවේය. මෙම විකෘති නිසා අභිධර්මය ඉතා සංකීර්ණ දුරස්ථ දෙයක් බවට පත්විය. ත්‍රිපිටකගත අභිධර්මයේ හා මෑතකාලීන ග්‍රන්ථ අතර බොහෝ මූලධර්ම වෙනස්කම් ඇත. ඒවා හැදෑරූ අයද මෙම වෙනස නොදැනීම නිසා අභිධර්මය ගැන විවේචන ඉදිරිපත් කළහ. සමහරු අභිධර්මය බුද්ධ භාෂිතයක් නොවේ යැයි කීමටද පෙලඹුනහ. මේ නිසා අභිධර්මය ගැන සැක දුරුකරගතයුතුව ඇත. සූත්‍ර හා විනය පිටකවලම අභිධර්මය ගැන සඳහන් වන තැන් කිහිපයක් ඇත.

## අභිධර්මය ගැන විනය හා සූත්‍ර පිටකයේ සඳහන් තැන්

දීඝනිකාය-සඞ්ගීතිසූත්‍රයේ එන දහම් පාඨයක මෙසේ සඳහන් වේ.

(''පුන ච පරං, ආවුසෝ, භික්ඛු ධම්මකාමෝ හෝති පියසමුදාහාරෝ, අභිධම්මේ අභිවිනයේ උළාරපාමොජ්ජෝ. යංපාවුසෝ, භික්ඛු ධම්මකාමෝ හෝති --පෙ-- උළාරපාමොජ්ජෝ. අයම්පි ධම්මෝ නාථකරණෝ '' )

**තේරුම**: තවද අනිකෙක ඇවැත්නි, මහණ තෙම ධර්මයට කැමැත්තේ, ධර්මය ඇසීමෙහි දේසනා කිරීමෙහි ප්‍රිය වෙත්ද, සුවිශේෂි ධර්මයෙහි (අභිධම්මේ), විශේෂ විනයෙහි බොහෝ සතුටු වෙයි. යම් හෙයකින් භික්ෂුව ධර්මයට කැමැත්තේ ..... බොහෝ සතුටු වෙයිද, මෙයද නාථකරණ (අසරණ නොවීම පිණිස පවතින) ධර්මතාවයකි.

-----------------------------------------------------------------

අභිධර්මය ගැන බුද්ධකාලයේ විසූ මහා ශ්‍රාවකයන් අතර ඇතිවූ කතාබහක් පහත දැක්වේ. එක්තරා රාත්‍රියක සැරියුත් හිමියන් මුගලන්, කාශ්‍යප, ආනන්ද, රේවත යනාදී මහාශ්‍රාවක හිමිවරුන් ගෝසිඬග නැමැති සල්වනයක මුණ ගැසුනහ. සල් මලින් විචිත්‍රවත් වූ මල්සුවඳ විහිදීයන එම සල්වනය තවදුරටත් ශෝභමානවනුයේ කුමන ආකාරයක විහරණයක යෙදෙන භික්ෂුවක ගෙන්දැයි කථාවට බඳුන් විය. ඉර්ධිප්‍රාතිහාර්ය පෑමේ අග්‍ර මුගලන් හිමියන් පැවසූයේ මෙලෙසිනි.

(''කථං රූපේන, ආවුසෝ මොග්ගල්ලාන, භික්ඛුනා ගෝසිඞ්ගසාලවනං සෝභෙයියාති '' ? '' ඉධාවුසෝ සාරිපුත්ත, ද්වේ භික්ඛූ අභිධම්මකථං කථෙන්ති, තේ අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති, අඤ්ඤමඤ්ඤස්ස පඤ්හං පුට්ඨා විස්සජ්ජෙන්ති, නෝ ච සංසාදෙන්ති ධම්මී ච නේසං කථා පවත්තිනී හෝති. එවරූපේන බෝ, ආවුසෝ සාරිපුත්ත, භික්ඛුනා ගෝසිඞ්ග සාලවනං සෝභෙය්‍යාති.'')

මජ්ඣිමනිකාය මූලපණ්ණාසපාළි මහාගෝසිඞ්ගසූත්‍රය

''ඇවත්නි සාරිපුත්තයනි, භික්ෂූන් දෙනමක් අභිධර්මය ගැන (ගැඹුරු ධර්මතා ගැන) කථාකරත්ද, ඔවුහු එකිනෙකාගෙන් ප්‍රශ්ණ කරත්ද, පැනනැඟුනු ප්‍රශ්ණ විසදත්ද, විසඳීමෙහි නොහැකිලෙත්ද, ධර්මයට අනුකූලවම කථාව පවත්වත්ද, මේ ආකාරයේ භික්ෂුවකගෙන් ගෝසිඞ්ග සල්වනය ශෝභමාන වනු ඇත.''

---

විනය පිටකයේ භික්ෂු ප්‍රාතිමෝක්ෂ සීලයට අදාළ ශික්ෂා පදයක විස්තරයෙහි අභිධර්මය සම්බන්ධව සුවිශේෂි සඳහනක් දක්නට ලැබේ. මුලින් එම සිඛ පදය මෙලෙසය.

**''යෝ පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානේ ඒවං වදෙය්‍ය : ''කිං පනිමේහි ඛුද්දානුඛුද්දකේහි සික්ඛාපදේහි උද්දිට්ඨේහි, යාවදේව කුක්කුච්චාය විහේසාය විලේඛාය සංවත්තන්තීති, සික්ඛාපද විවණ්ණකේ පාචිත්තියං ''**

**භික්ෂුපාචිත්තියපාලිය - විලෙඛනසික්ඛාපදය**

**තේරුම:** "යම් භික්ෂුවක් ප්‍රාතිමෝක්ෂය උදෙසන කල්හි මෙසේ කියත්ද - "කුමක් හෙයින් වනාහි මෙම කුඩා අනුකුඩා සික්ෂාපද උදෙසත්ද,යම්තාක් කුකුස් පිණිසද වෙහෙස පිණිසද අපහසු බව පිණිසද සංවර්තනය වෙත් යැයි " ශික්ෂාපදයන්ට ගැරහීමේ පාචිත්තිය වේයනුයි."

මේ සිඛපදයෙන් වරදට හසු නොවන විශේෂ අවස්ථා (අනාපත්ති) පිළිබඳ පාලි පාඨය පහත අයුරිනි.

**අනාපත්ති** - ''න විවණ්ණේතුකාමෝ, ඉඞ්ඝ ත්වං සුත්තන්තේ වා ගාථායෝ වා අභිධම්මං වා පරියාපුණස්සු, පච්ඡා විනයං පරියාපුණිස්සසීති භණති, ....'')

**වරද නොවන අවස්ථා** - '' විනයට ගැරහීමේ අදහසකින් තොරව කියත්ද, "නුඹ දැනට සූත්‍රාන්තය හෝ ගාථාවන් හෝ අභිධර්මය

හදාරව, පසුව විනය හදාරන්නට හැකි වන්නෙහි" යැයි පවසත්ද .....''

ඉහත පාලි පාඨයේ සූත්‍ර හා අභිධර්මය යන පද වෙන වෙනම සඳහන්ව ඇත. මීට පෙරාතුව දැක්වූ සූත්‍ර පාඨයන්ගෙන් දැක්වෙන අභිධර්ම වචනය අභිධර්ම පිටකයට විශේෂිතවම නොවේ. සාමන්‍යයෙන් අභිධර්මය යන වචනය ගැඹුරුදහම් යන අරුතින් යෙදිය හැකි වුවද ඉහතදී එය අභිධර්ම පිටකය සඳහාම යෙදුණු බව පෙනේ.

-----------------------------------------------------------------

විනය පිටකයේ භික්ෂුනීන්ට අදාළ ශික්ෂාපදයකද සූත්‍ර අභිධර්ම යන වචන වෙන වෙනම සඳහන්ව ඇත.

(''යා පන භික්ඛුනී අනෝකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡෙය්‍ය, පාචිත්තිය''න්ති. සුත්තන්තේ ඕකාසං කාරාපෙත්වා විනයං වා අභිධම්මං වා පුච්ඡති, ආපත්ති පාචිත්තියස්ස. විනයේ ඕකාසං කාරාපෙත්වා සුත්තන්තං වා අභිධම්මං වා පුච්ඡති, ආපත්ති පාචිත්තියස්ස. අභිධම්මෙ ඕකාසං කාරාපෙත්වා සුත්තන්තං වා විනයං වා පුච්ඡති, ආපත්ති පාචිත්තියස්ස. ''

**භික්ඛුනීවිභඞ්ගය - ඡත්තුපාහනවර්ගය**

අවසර නොගෙන භික්ෂුවකගෙන් භික්ෂුනියක් විසින් ප්‍රශ්ණ විචාරීම සම්බන්ධව ඇති ශික්ෂාපදයක අභිධර්මය සඳහා අවසර ගෙන විනය හෝ සූත්‍ර පිළිබඳවද සූත්‍ර සඳහා අවසර ගෙන අභිධර්මය හෝ විනය කාරණා ගැනද විචාරිය නොහැකි බව ඉහත සඳහන් වේ.

-----------------------------------------------------------------

තථාගතයන් වහන්සේ තව්තිසාවේ අභිධර්ම දේශනාව පවත්වන අතරතුර ඒ ඒ දිනයන්හි දේශිත ප්‍රමාණය මනු ලොවට

වැඩමකර සැරියුත්තෙරණුවන්ට දේශනා කළසේක. එය අග්‍රශ්‍රාවකයන් වහන්සේ තම ශිෂ්‍ය පිරිසට ඉගැන්වූ සේක. අභිධර්මය හදාරමින් ධාරණය කරගත් ස්වාමීන් වහන්සේලා එය පළමු සංගායනාවේදී සංගායනා කළහ. ඒ බවට චුල්ලවග්ගපාලියෙහි පහත එන සංග්‍රහ ගාථාවද සාක්ෂි දරයි.

**("උපාලිං විනයං පුච්ඡි, සුත්තන්තානන්දපණ්ඩිතං**

**පිටකං තීණි සඞ්ගීතිං, අකංසු ජිනසාවකා".)**

විනයපිටකය-චූළවග්ගපාළි
පඤ්චසතිකක්ඛන්ධකං

උපාලි හිමියන් විනය විචාරන ලද බවත්, සූත්‍ර ආනන්ද හිමියනුත්, බුදධශ්‍රාවකයෝ තුන්පිටකයම සංගායනා කළබවත් ඉහත ගාථාවෙන් පෙන්නුම් කරයි.

ඉහත සූත්‍ර හා විනය පිටකයේ උධෘත කාරණාත් ඉතිහාස ග්‍රන්ථවල සඳහන් නොයෙකුත් සාධකත් සැලකීමෙන් බුදුන් වහන්සේ අභිධර්මය දේශනා කළබව ස්ථිරය.

## නිවන් දකින්නට අභිධර්මය ඉගෙනගතයුතුමද?

බුදුරජාණන් වහන්සේ අභිධර්මය දේශනා කළේ සත්වන වස්කල දීය. ඊට පෙරාතුවද බොහෝ දෙනා නිවන් දුටුවහ. ඒ නිසා සූත්‍ර හැදෑරීමම ප්‍රමාණවත් බව අභිධර්මය ගැන සැක ඇති සමහරෙක් පවසති. මෙසේ ඇතිවිට සත්වන වර්ෂයෙන් පසු දේශනා කරන ලද සූත්‍රද අනවශ්‍යය. ඇත්තෙන්ම සත්වන වස්කාලයට පෙර ගැඹුරු දහම් කාරණා විටන් විට දේසනා නොකළා යැයිද කිව නොහැක. මන්ද යත් අභිධර්මපිටකයේ විවරණ බොහෝ සූත්‍ර විවරණයන්හි සඳහන් බැවිනි.

අද කාලයේ කෙටියෙන් දහම් අසා නිවන් දැකීමට සමත් උග්ඝටිතඤ්ඤ පුග්ගලයෝ මනුස්ස ලෝකයේ නම් නැත. මෙකල

සිටින්නේ ධර්මය අසමින් ඇසූ ධර්මය හදාරමින් භාවනා කරමින් ක්‍රමානුකූල ප්‍රතිපදාවකින් නිවනට ලංවිය හැකි නෙය්‍ය පුද්ගලයෝය. අභිධර්මපිටකය හදාරා ඇති, එම දහම් කාරණා තම ජීවිතයට ගලපා ගත් ආචාර්යවරයෙක් යටතේ භාවනා වඩන යෝගාවචරයෙකුට, එම කල්‍යාණ මිත්‍ර ඇසුර නිසා වඩාත් වේගයෙන් ඉදිරියට යා හැක. මේ නිසාම තථාගතයන් වහන්සේ ගෝලයන් තනන ආචාර්යවරයෙකු ගැඹුරු දහම් දැනුමකින් සමන්විත වියයුතු බව ප්‍රකාශ කළේය.

විනයපිටකයෙහි මහාවග්ග පාලියෙහි එකරුණ මෙසේ සඳහන් වේ.

**''පඤ්චහි, භික්ඛවේ, අඞ්ගේහි සමන්නාගතේන භික්ඛුනා උපසම්පාදේතබ්බං, නිස්සයෝ දාතබ්බෝ, සාමණේරෝ උපට්ඨාපේතබ්බෝ. පටිබලෝ හෝති අන්තේවාසිං වා සද්ධිවිහාරිං වා අභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියකාය සික්ඛාය විනේතුං, අභිධම්මේ විනේතුං, අභිවිනයේ විනේතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතෝ විවේචේතුං - ඉමේහි ඛෝ, භික්ඛවේ, පඤ්චහඞ්ගේහි සමන්නාගතේන භික්ඛුනා උපසම්පාදේතබ්බං, නිස්සයෝ දාතබ්බෝ, සාමණේරෝ උපට්ඨාපේතබ්බෝ. ''**

උපසම්පදාව ලබාදෙන, අන්අයට නිශ්‍රයවීමට සුදුසු, සාමණේරයන් හිකමවීමට සුදුසු ආචාර්යවරයෙක් සතුව තිබිය යුතු ගුණාංග පහක් ඉහත දැක්වේ. තම අතවැසියන් අභිධර්මයේ හික්මවීමට ඇතිහැකියාව එයින් එක් අංගයකි.

අභිධර්ම පිටකය හදාරා නැති, තරමක හෝ අභිධර්ම කාරණා ඉගෙන ගෙන නැති නමුත් සූත්‍ර පිටකය බොහෝ සෙයින් හදාරා ඇති අය සමග කථා කිරීමේදි මා හට දක්නට ලැබුණු කාරණා කිහිපයකි. ඔවුන් තුළ කුසලය අකුසලය නිශ්චිතව හඳුනාගැනීමේ දුර්වල බවක් දුටුවෙමි. ඔවුනට කුසලය හා අකුසලයේ ප්‍රභේද පිළිබඳ ඇත්තේද අල්ප දැනුමකි. කර්මවිපාකය හා නව කර්මය පිළිබඳ ඇත්තේ අපැහැදිලි දැනුමකි. විඤ්ඤානය හා එය හා

බැඳුනු මානසික ධර්මයන්ගේ එක්ව හටගැනීම බිඳීම පිළිබද පුළුල් දැනුමක් ඔවුනට නැත. උපාදානයට ලක්වන ධර්මයන් අනිත්‍යාදි ලෙස මෙනෙහි කිරීම සඳහා ගොනුකරගන්නා ආකාරය පිළිබඳ නිශ්චිත වැටහීමකින් තොරය.

ගැඹුරු ධර්මය අධ්‍යයනය තුළින් සෘජුවම ලැබෙන ප්‍රයෝජන කිහිපයක් මෙසේය.

- අනිත්‍ය සංඥාව සියුම් ලෙස මතුකරගැනීමට.
- අනාත්ම දර්ශනය මතුකරගැනීමට.
- හේතුඵල සම්බන්ධතා පුළුල් ව තේරුම් ගැනීමට
- නිශ්චිතව ධර්මය උගෙනීමට
- ධර්මය ගැන ඉස්මතුවන ව්‍යාකූල අදහස් සමථයට පැමිණවීමට

ධර්මය හැදෑරීම කිසි අයුරකින් නිවනට බාධක ධර්මයක් නොවේ. "**ධම්මකාමී භවං හෝති ධම්මදෙස්සී පරාභවෝ**" යනු බුදුවදනයි. ධර්මයට කැමැත්තා දියුණුවන බවත් එයට රුචි නොකරන අකමැති කෙනා පිරිහෙන බවත් ඉන් ප්‍රකාස වේ. ළමයින් ලෙස වසර ගණනාවක් අධ්‍යාපනය ලබා පසුව රැකියාවක් කරන අවධියේ ප්‍රතිලාභ ලබයි. බුදුදහම ඉගෙනීම එලෙසින් පසුව ප්‍රතිඵල ගෙනදෙන්නක් පමණක්ම නොවේ. සත්ධර්මය නම් හදාරන විටම කුසලය වර්ධනය කරයි. ගුණධර්ම දියුණු වේ. ඥානය විසද කරයි. නිතර භාවනා කරන්නන්ම ධර්මය වඩාත් හදාරන බව අපගේ නිරීක්ෂණයයි.

සමහර ආචාර්යවරු ධර්මය උගෙනීම එතරම් අවශ්‍ය නැතැයිද වඩාත් වැදගත් වනුයේ භාවනාව යැයිද ප්‍රකාශ කරන අවස්ථා විටෙක දක්නට ලැබේ. නමුත් හොඳින් සොයා බැලූවිට

පෙනෙනුයේ ඔවුන් බොහෝ සෙයින් ධර්මය හදාරා යම් මට්ටමකට භාවනාව දියුණු කරගත් අය බවයි. එසේ ප්‍රකාශ කිරීම නැග්ග ඉනිමඟට පයින් ගැසීමක් වැනිය.

## අභිධර්මයේ මූලික සැකැස්ම

කෘති සතකින් අභිධර්ම පිටකය සමන්විතය.

1. ධර්මසංගණීප්‍රකරණය
2. විභංගප්‍රකරණය
3. ධාතුකථා
4. පුග්ගලපඤ්ඤත්ති
5. කථාවත්ථු
6. යමකප්‍රකරණය
7. පට්ඨානය

මෙම කෘතියේ අරමුණ නාම-රූප ධර්ම ගැන පුළුල් අවබෝධයක් ලබාදීම නොවේ. ඇත්තෙන්ම නාම-රූප ධර්ම නිවැරදිව හඳුනාගැනීමට බාධක වන අභිධර්මය ලෙසින්වන ධර්ම ප්‍රතිරූපක පෙන්වාදීමය. විද්‍යුත් මාධ්‍යවල දියුණුවත් විචිත්‍ර ධර්මකථික ස්වාමීන්වහන්සේලා නිසාත් වෙනදාට වඩා ධර්මප්‍රබෝධයක් ධර්ම ගවේෂණයට උනන්දුවක් බොදු ජනතාව තුළ ඇතිව තිබේ. සාමාන්‍ය ජීවිතය ගැන කලකිරුණු බොහෝදෙනා අධ්‍යාත්මික සැනසීමක් සොයනබව පෙනෙන්නට තිබේ.

මේ අය අතරින් සමහරෙක් කෙටික්‍රම සෙවීමට ගොස් අමාරුවේ වැටෙන අවස්ථාද බහුලය. දිනයෙන් දෙකෙන් ධ්‍යාන මාර්ගඵල දෙන ආයතනද අද සුලබය. වැරදි නිරුක්ති ක්‍රම ඔස්සේ සද්ධර්මය විකෘති කරන මාරාවේෂයෙන් මෙන් ක්‍රියාත්මක වන්නන්ටද පිරිසක් හසුවී ඇත. මේ දෙකින්ම ගැලවුණු තරමක බුද්ධියක් ඇත්තා ඊළගට හසුවන විදර්ශනා ප්‍රතිරූපක අන්ත දෙකකි. එනම් විඤ්ඤානවාදය හා පරමාණුවාදයයි. සිල්ගුණයෙන් යුත් සත්පුරුෂ හිමිවරුන්

තුළින්ද මෙම අන්ත දෙක ඔස්සේ කරුණු කියෙවන නිසා මේවා අන්තබව සාමාන්‍ය කෙනෙකුට කිසිලෙසකින් සිතාගත නොහැක. අභිධර්මප්‍රතිරූපකව ඉදිරිපත්වන නිසාත් කාරණය අතිශයින් සංකීර්ණය. එයට හේතුව බොහෝ දෙනා ත්‍රිපිටකගත අභිධර්මය පරිශීලනය කෙසේ වෙතත් එම පොතක් වත් අල්ලා නැති නිසාය.

කෙළෙස් තවන වැර ඇතිව නිවනට යොමුකළ සිත්ඇතිව වීර්යකරන යෝගාවචරයින් විසින් මෙම අන්තදෙක පිළිබඳ යම් පමණක දැනුමක් අනිවාර්යයෙන්ම ලබාගතයුතු බව අපගේ විශ්වාසයයි. මෙම අන්තදෙක මාරයා විසින් ඇටවූ සියුම් දැලක් වැනිය. මෙකල්හි බුදුහිමියන් වැඩසිටියා නම් කාමසුඛල්ලිකානුයෝග යටත් අත්තකිලමථානුයෝගයටත් අමතරව තවත් අන්තදෙකක් ලෙස නම්කරනවා ඇත.

පරමාණුවාදයට සම්බන්ධව ඇති පරමාර්ථ සම්මුති අදහස පිළිබඳ විවරණය මෙහි පළමුව දක්වා ඇත. මෙය එක්තරා ආකාරයකට සියුම්ව වාග්ව්‍යවහාරය සමගද සම්බන්ධයක් ඇත. වචන භාවිතය පිළිබඳ පටලැවිල්ලක් ඇති බැවින් මුලින්ම වචනශෝදන වාරයක් ඉදිරිපත් කිරීමට සිදුවුණි. වචන භාවිතය හා බැඳුණු සිතිවිලි රටාව පිළිබඳ අවබෝධය විදර්ශනාවේ දියුණුවට ඉතා වැදගත්ය. පහත සූත්‍ර පාඨයෙන් මනාව එය පෙන්නුම් කරයි.

**''අක්ඛෙය්‍යසඤ්ඤිනෝ සත්තා, අක්ඛෙය්‍යස්මිං පතිට්ඨිතා අක්ඛෙය්‍යං අපරිඤ්ඤාය, යොගමායන්ති මච්චුනෝ.”**

(වචනවලින් කියන දෑ පිළිබඳ සත්වයෝ සංඥාව ඇත්තාහුය. වචනයෙහි ඔවුන් පිහිටා සිටී. වචනය පිරිසිඳ නොදැකීමෙන් මාරයාගේ වසඟයට යන්නාහුය.)

## බුද්ධකාලීන අභිධර්මය හා පසුකාලීනව ඇතිවූ වෙනස්කම්.

පසු කාලයේ දී ලියවුණු සංග්‍රහ ග්‍රන්ථ නිසා අභිධර්මය ගැන සාවද්‍ය අදහස් ඇතිවී තිබෙන බව පෙර සඳහන් කරන ලදි. එවන් එක් කරුණක් වූයේ නාම රූප ධර්මයන් අතිසූක්ෂම දෑ බවත්, සාමාන්‍ය මනසට අරමුණු නොවන ධර්මයන් ලෙසටත්ය. විදර්ශනා භාවනාවේ එක් මූලික පදනමක් වනුයේ, අනිත්‍ය මනසිකාරයයි. අනිත්‍ය ලෙස මෙනෙහි කරණුයේ නාම රූප ධර්මයි. නමුත් නාම රූප ධර්ම සාමාන්‍යයෙන් අරමුණු නොවන්නේ නම් ඒවායේ අනිත්‍යතාවය මෙනෙහි කිරීම පසුවට කල් දැමීමට යෝගාවචරයන්ට සිදුවේ. මෙවිට ප්‍රායෝගික ප්‍රතිපදාවෙන් බැහැර වීමක් සිදුවේ.

ත්‍රිපිටකගත අභිධර්මය කියවා නැති බොහෝ විද්වතුන් මෙවන් වෙනස්කම් නොදන්නා නිසා, බුද්ධභාෂිත අභිධර්මය ගැනත් සැක පහළ කරගනී. මෙම දෝෂය පසුකාලීන අභිධර්ම ග්‍රන්ථ තුලින් ඉදිරිපත් වනුයේ පරමාර්ථ - සම්මුති න්‍යාය ඔස්සේය. පසුකාලීන අභිධර්මය යනු ත්‍රිපිටකගත අභිධර්මය නොව එයට අර්ථ විවරණ, සන්න ලෙස බුද්ධ කාලයෙන් පසුව සංග්‍රහ වූ ග්‍රන්ථයි. බොහෝ ථේරවාදී අභිධර්මය ග්‍රන්ථ තුලද මෙම දෝෂය දැකිය හැක.

## පරමාර්ථ සහ සම්මුති (පඤ්ඤත්ති) සංකල්පය

ලොව සැබෑවටම ඇති දේ පරමාර්ථ ලෙසද සැබෑවටම නැති දේ සම්මුති හෝ පඤ්ඤත්ති ලෙසද මෑතකාලීන සමහර අභිධර්ම පොත්වල දක්නට ඇත. සැබෑවටම ඇති හෙවත් විද්‍යමාන දේ චිත්ත, චෛතසික, රූප, නිර්වාණය ලෙස දැක්වේ. නමුත් සැබෑවටම නැති අවිද්‍යමාන ලෙස දක්වා ඇති දෙයින් සමහරක් නම් ඇඳ, පුටු, මේස, යාන, වාහන යනාදියයි. මෙවැනි දෑ සැබෑවටම නැති ලෙසට හෝ පරමාර්ථ වශයෙන් නැති බවට හෝ කිසිම ත්‍රිපිටකගත බුද්ධභාෂිතයක දක්නට නොමැත. ඇඳ, පුටු, මේස හෝ වෙනත්

වස්තූන් එලෙසින් හඳුනාගන්නා සංඥා ප්‍රහානය කළයුතු දේ ලෙස හෝ දක්වා නැත. නමුත් පසුකාලීන අභිධර්ම අදහසට අනුව ආත්ම දෘෂ්ටිය මෙන් එවන් සංඥාද අවබෝධය තුලින් ප්‍රහානය කළයුතු ලෙස හැගෙයි. එවිට රහතන් වහන්සේ තමන් අවට වස්තූන් හඳුනා නොගන්නේදැයි ගැටළුවක් පැනනගී.

රූප පිළිබඳ ගැඹුරු ලෙස පෙනෙන නමුත් අනවශ්‍ය පරමාණුක විවරණයක් තුලින් ඉහත වස්තූන් නැති ලෙස දැක්වුණි. ඉතා සියුම් රූප කළාප සමුදායක එකතුවක් මිස, ඉහත සඳහන් කළ වස්තූන් සත්‍යලෙස විද්‍යමාන නොවන බව දැක්වුණි. විද්‍යමාන නොවන බැවින් ඒවායේ අනිත්‍යතාවයක් ගැන කථාකළ නොහකි බවක්ද දැක්වෙයි. ඇත්තෙන්ම යමක් අවිද්‍යමාන නම් එහි හටගැනීමක් හෝ නැතිවීමක් ගැන කථාකළ නොහැක. හඳේ හාවාගේ මරණයක් කියා දෙයක් නැත. මිනිස් සිරුරද මෙසේ ගත්කළ සැබෑවට විද්‍යමාන නොවන ධර්මයකි.

මෙවිට ශරීරයේ අනිත්‍යතාවය මෙනෙහි කරන්නේ කෙලෙසදැයි මහපටලැවිල්ලක් ඇතිවිය. සතර සතිපට්ඨාන දේශනාවේදි බුදුහිමියන් කායානුපස්සනාව මුලින් දැක්වූයේ කය කෙළෙස් වලට බොහෝ විට අරමුණක් වන නිසාත් කය සිතට වඩා පහසුවෙන් ගෝචර කරගත හැකි දෙයක් නිසාත් යැයි විද්වතුන්ගේ පිළිගැනීමයි. නමුත් රූප පිළිබඳ පරමාණුක විවරණය ඔස්සේ විදර්ශනාවට බැසීමට උත්සාහ කළ යෝගාවචරයන්ට වූයේ ලිහා ගත නොහැකි අවුලක සිරවීමටය.

පරමාර්ථ සහ සම්මුති යන සදොස් න්‍යාය කෙසේ වෙතත් ඒ සඳහා යෙදූ වචනද දෝෂ සහිතය. සදාකාලික ආත්මයක පැවැත්ම වෙනුවට නිත්‍ය නොවූ නාම-රූප ක්‍රියාකාරිත්වයක් ඔස්සේ සත්වයෙකුගේ පැවැත්ම පැහැදිලි කිරීමට බුදුන්වහන්සේට හැකි විය. මෙම නාම, රූප ධර්මයන්ගේ විවිධත්වය ඒවායේ අනන්‍ය ආකාරයන් පැහැදිලි කළයුතු විය. ධාතු යන වචනය මේ සඳහා යෙදින. විවිධ ස්වභාව ධර්මයන්ගේ නානාආකාරය විදහා දැක්වෙන ධාතුසංයුක්තයේ එන සූත්‍ර පාඨයක් මෙලෙසය.

**''කතමඤ්ච, භික්ඛවේ, ධාතුනානත්තං? චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සෝතධාතු සද්දධාතු සෝතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනෝධාතු ධම්මධාතු මනෝවිඤ්ඤාණධාතු - ඉදං වුච්චති, භික්ඛවෙ, ධාතුනානත්තං ''**

"මහණෙනි, ධාතුන්ගේ විවිධත්වය කුමක්ද? චක්ඛුධාතු රූපධාතු ..පෙ... මනෝවිඤ්ඤාණධාතු- මහණෙනි, ධාතුන්ගේ නානත්වය මෙයැයි ."

නමුත් පසුකාලීනව මේ සඳහා පරමාර්ථ යන වචනය බොහෝ සෙයින් භාවිත විය. පාලියේ පරමත්ථ වචනය සිංහලෙන් පරමාර්ථ විය. පරම+අත්ථ යනු උතුම් ශ්‍රේෂ්ඨ හෝ අවසාන අර්ථය යනුයි. ''**සෝ ච හෝති අභිරූපෝ දස්සනීයෝ පාසාදිකෝ පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ** '' ත්‍රිපිටකයේ බොහෝ විට දක්නට ඇති ඉහත වාක්‍යයේ පරම යන වචනය උතුම් යන අර්ථයෙන් යෙදී ඇත. මෙම විවිධ ධාතුන්ම චිත්ත චෛතසික රූප නිර්වාණ ලෙස වෙනත් ආකාරයකට සංග්‍රහ කළහැක. ලෝභ, ද්වේෂ, මෝහ යනාදී අකුසල ධර්මයන්ද චිත්ත, චෛතසික තුළ සංග්‍රහ වේ. මෙසේ ඇතිවිට ප්‍රහාණය කළයුතු හීන ධර්මයන්ද පරම උතුම් අර්ථයන් ලෙස දැක්වූවා වැනිය.

තවදුරටත් පරමාර්ථ යන වචනය ත්‍රිපිටකය හා පැරණි ග්‍රන්ථවල යෙදුනු ආකාර පිළිබඳ නිදසුන් කිහිපයක් මෙලෙසය.

- චූළනිද්දෙසපාළි

''ආරද්ධවීරියෝ පරමත්ථපත්තියා, අලීනචිත්තෝ **අකුසීතවුත්ති දළ්හනික්කමො ථාමබලූපපන්නො, ඒකො චරේ ඛග්ගවිසාණකප්පො.''**

(ආරද්ධවීරියො පරමත්ථපත්තියාති පරමත්ථං වුච්චති අමතං නිබ්බානං - අටුවා)

**''පරමඅර්ථයට පැමිනීමට ඇරඹූ වීර්ය ඇති''** යන පාඨයෙහි අමෘත නිවන පරමඅත්ථං යැයි කියනු ලැබේ යැයි අටුවා විවරණයයි.

■ **පටිසම්භිදාමග්ගපාළි**

**''පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමත්ථං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති. ''**

''පංචස්කන්ධයාගේ නූපදීම පරමාර්ථ නිවන යැයි දකින්නේ සම්මත්තනියාමයට බැසගනී.''

■ **මිලින්දප්‍රශ්ණය**

**''ඒතානි චෙව, මහාරාජ, අඤ්ඤානි ච අනේකානි දේවතාකොටිසතසහස්සානි ගිහී අගාරිකා කාමභොගිනො සන්තං පරමත්ථං නිබ්බානං සච්ඡිකරිංසු ''**

''මහරජ,අනෙකුත් නොයෙක් කෝටි ගණනින් දෙවියන්ද නිවෙස්හි වසන කාමභොගී ගිහියන්ද සාන්ත වූ පරමාර්ථ වූ නිවන සාක්ෂාත් කළහ.''

ඉහත සාධකවලින් පෙන්නුම් කරන්නේ පරමාර්ථ යන වචනය නිවනට පරියාය නමක් ලෙස මුත් නාම, රූප ධර්මයන් කෙරෙහි බුද්ධ කාලයේ නොයෙදුණු බවයි. අනන්‍ය වූ නාම-රූප ධර්මයන් ඇතිබව අපද පිළිගනිමු. ඒවාට ස්කන්ධ, ධාතු, ආයතන ලෙස නාමකරණය වඩාත් යෝග්‍ය බව අපගේ පිළිගැනීමයි. නමුත් බොහෝ දෙනාට කාවැදී ඇති වචනයක් නිසා පැහැදිලි කරදීමේ පහසුවතකා මෙම කෘතිය තුළද පරමාර්ථ යන වචනය විද්‍යමාන දේ සඳහා යෙදීමට සිදුවිය.

වචන යනු එම භාෂාව භාවිත කරන්නන් අතර සම්මුතියක් විනා එතරම් සැළකිලිමත් විය යුතු දෙයක් නොවේ යැයි සමහර විට ඔබට සිතෙන්නට පුළුවන. නමුත් බුද්ධවචන පිළිබඳ එය එසේම නොවන බව පහත සූත්‍රය පෙන්නුම් කරයි.

<u>අඞ්ගුත්තරනිකාය- දුකනිපාතපාළි -අධිකරණවර්ගය</u>

**''ද්වේමේ, භික්ඛවේ, ධම්මා සද්ධම්මස්ස සම්මෝසාය අන්තරධානාය සංවත්තන්ති. කතමේ ද්වේ? දුන්නික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං, අත්ථෝ ච දුන්නීතො. දුන්නික්ඛිත්තස්ස, භික්ඛවේ, පදබ්‍යඤ්ජනස්ස අත්ථෝපි දුන්නයෝ හොති. ඉමේ ඛෝ, භික්ඛවේ, ද්වේ ධම්මා සද්ධම්මස්ස සම්මෝසාය අන්තරධානාය සංවත්තන්තීති.''**

**''ද්වේමේ, භික්ඛවේ, ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මෝසාය අනන්තරධානාය සංවත්තන්ති. කතමේ ද්වේ? සුනික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං, අත්ථෝ ච සුනීතෝ. සුනික්ඛිත්තස්ස, භික්ඛවේ, පදබ්‍යඤ්ජනස්ස අත්ථෝපි සුනයෝ හෝති. ඉමේ ඛෝ, භික්ඛවේ, ද්වේ ධම්මා සද්ධම්මස්ස ඨිතියා අසම්මෝසාය අනන්තරධානාය සංවත්තන්තීති.''**

**තේරුම :** මහණෙනි කාරණා දෙකක් සද්ධර්මය අවුල්වීම පිණිසත් අතුරුදහන් වීම සඳහාත් බලපායි. කුමක්ද ඒ දෙකරුණ? නොමනා ලෙස තැබූ පදමාලාවත්, නොමනා ලෙස පමුණුවන අර්ථයත්ය. මහණෙනි වැරදියට තැබූ පදමාලාවෙන් පමුණුවන අර්ථයද දොස් සහිතය. මෙම කාරණා දෙක මහණෙනි සද්ධර්මය අවුල්වීම පිණිසත් අතුරුදහන් වීම සඳහාත් බලපායි.

මහණෙනි කාරණා දෙකක් සද්ධර්මය අවුල්නොවීම පිණිසත් අතුරුදහන් නොවීම සඳහාත් බලපායි. කුමක්ද ඒ දෙකරුණ? මනාලෙස තැබූ පදමාලාවත්, මනාලෙස පමුණුවන අර්ථයත්ය. මහණෙනි නිවැරදි ලෙස තැබූ පදමාලාවෙන් පමුණුවන අර්ථයද නිදොස්ය. මෙම කාරණා දෙක මහණෙනි සද්ධර්මය අවුල්නොවීම පිණිසත් අතුරුදහන් නොවීම සඳහාත් බලපායි.

## පඤ්ඤත්ති හෙවත් පැනවීම් යනු කුමක්ද

සිතට හසුවන දැනෙන ඕනෑම දෙයක් අන්අයට පැවසීමේදී, හඳුන්වාදීමේදී සිදුවන නාමකරණයට, යෙදූ පාලිභාෂාවේ වචනය පඤ්ඤත්ති යන්නය. සිංහලෙන් පැනවීම් කියා කිව හැක. නාමකරණය යනු බොහෝ දෙනෙකුගේ සම්මතයක් බැවින් සම්මුති කියාද කිව හැක. නිරුත්ති අධිවචන යනුද පඤ්ඤත්ති යන්නට සමාන අර්ථවත් පද වේ. අභිධර්ම පිටකයේ ධම්මසඞ්ගණීපාළියේ මෙම පද අර්ථ දක්වා ඇත්තේ මෙලෙසිනි.

(1313. කතමෙ ධම්මා අධිවචනා? යා තේසං තේසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරෝ නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපෝ - ඉමේ ධම්මා අධිවචනා. සබ්බේව ධම්මා අධිවචනපථා.)

(1314. කතමේ ධම්මා නිරුත්ති? යා තේසං තේසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරෝ නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපෝ - ඉමේ ධම්මා නිරුත්ති. සබ්බේව ධම්මා නිරුත්තිපථා.)

(1315. කතමේ ධම්මා පඤ්ඤත්ති? යා තේසං තේසං ධම්මානං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරෝ නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපෝ - ඉමේ ධම්මා පඤ්ඤත්ති. සබ්බේව ධම්මා පඤ්ඤත්තිපථා.)

ඉහත එම පදයන් සමාන ලෙස අර්ථ දක්වා ඇති ආකාරය දක්නට ලැබේ. ව්‍යවහාරයක්, නමක්, නම්කිරීමක්, නම්දීමක්, නිරුත්තියක්, විශේෂවචනයක් යනාදී පද පඤ්ඤත්ති පදයේ අර්ථ ලෙස ඉහත දක්වා ඇත. නාමකරණය සත්වයන්ගේ සිතිවිලි හා බැඳුණු දෙයකි. කුඩාළමයින්ට දෙමව්පියන් නොයෙක් දේ පෙන්නා එහි නම ශබ්ද කොට කියයි. පසුව ළමයින් අදාළ ශබ්ද එම වස්තූන් සඳහා බොහෝ දෙනා බාවිත කරනබව තේරුම් ගනී. ලෝකයේ

අලුත් දෙයක් නිපදවූවිට පෙර හඳුනා නොගත් ශාකයක් සත්වයෙක් සොයාගත්විට පිරිසක් එකතුවී නමක් සම්මත කරගනී. යමක නම දැනීම යනු එමනම හෝ ශබ්දය පිළිබඳ අන්අයගේ සිත, සංඥාව දැනගැනීමක්ද වේ. අන්අය ඉදිරියේ යම්දෙයක නමක් අප භාවිතා කරණුයේ එම නාමකරණය, අසන්නන්ද දන්නේ යැයි අප විශ්වාස කරන නිසාය.

පොදුවේ සමූහයක් කෙරෙහි ඇති දැනුවත් බවක් හෝ සංඥාවක් යන අර්ථයෙන් පාලියේ සමඤ්ඤා යන වචනය යෙදෙන බව පෙනේ. සිත, සිතිවිලි වලින් වියුක්තව නාමකරණයක් ගැන කථා කළ නොහැක. ලෝකයේ සමහර යුගවල ජනසමාජ පිටින් විනාශ වී යයි. එවිට ඔවුන් භවිතා කළ නාමකරණයන් හෙවත් පැනවීම් ද නැතිවී යයි. ජන සමාජ පිටින් විනාශ නොවූවද කල් යාමේදි වාග්ව්‍යවහාරයන් වෙනස්වේ. දැන් ලංකාවේ භාවිතා වනුයේ වසර දෙදහසකට පෙර තිබූ වාග්ව්‍යවහාරයන් නොවේ. මෙම කාරණය මනාව ඉස්මතු වන බුද්ධ දේශනාවක් පහත දැක්වේ.

## <u>ඉසිගිලිසූත්‍රය - මජ්ඣිමනිකාය- උපරිපණ්ණාසය</u>

(ඒවං මේ සුතං ඒකං සමයං භගවා රාජගහේ විහරති ඉසිගිලිස්මිං පබ්බතෙ. තත්‍ර ඛෝ භගවා භික්ඛූ ආමන්තේසි, භික්ඛවෝති. භදන්තේති තේ භික්ඛූ භගවතෝ පච්චස්සොසුං. භගවා ඒතදවෝච. පස්සථ නෝ තුම්හේ, භික්ඛවේ, ඒතං වේභාරං පබ්බතන්ති ? ඒවං, භන්තේ. ඒතස්සපි ඛෝ, භික්ඛවේ, වේභාරස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති. පස්සථ නෝ තුම්හේ, භික්ඛවේ, ඒතං පණ්ඩවං පබ්බතන්ති ? ඒවං, භන්තේ. ඒතස්සපි ඛෝ, භික්ඛවේ, පණ්ඩවස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති.)

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලිපව්වේ වැඩවසන සේක් භික්ෂූන් වහන්සේලා අමතා " මහණෙනි නුඹලාට අර වේභාර පර්වතය පෙනෙනවා නේද? " එහෙමයි ස්වාමීනි.'' එම වේභාර පර්වතයට වනාහි වෙනත් සමඤ්ඤාවක් වෙනත් පැනවීමක් (පඤ්ඤත්ති) එකල්හි විය. " මහණෙනි

නුඹලාට අර පණ්ඩව පර්වතය පෙනෙනවා නේද? " එහෙමයි ස්වාමීනි''. එම පණ්ඩව පර්වතයට වනාහි වෙනත් සමඤ්ඤාවක් වෙනත් පැනවීමක් (පඤ්ඤත්ති) එකල්හි විය.

මේ නිසා වාග්ව්‍යවහාරය,නාමකරණය සකස් වූ (සංඛත) දෙයක් බව ඉහත සියළු කාරණා මැනවින් සළකා බැලුවහොත් ඔබට පෙනෙනු ඇත. එය අනිත්‍යතාවයෙන් මිදුනු ධර්මතාවයක් නොවන බවද පැහැදිලි විය යුතුය.

තවද භාෂාව, වාග්ව්‍යවහාර කෙළෙස් මෙන් ප්‍රහානය කළ යුත්තක්ද නොවේ. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළේද වචන භාවිතා කරමිනි. රහතන්වහන්සේලා අතරද වචන භාවිතා වේ. ලොව සැබෑවට ඇති දේද, නැති දේවල්ද ප්‍රකාශ කිරීමට වචන භාවිතා වේ. සත්‍යය වශයෙන් ඇති දේ පැනවීමට නාමකරණය හෙවත් පඤ්ඤත්ති යෙදුනු ආකාරය පහත සූත්‍ර පාඨයෙන් පෙන්නුම් කරයි.

(සෝ වතාවුසෝ, චක්ඛුස්මිං සති රූපේ සති චක්ඛුවිඤ්ඤාණේ සති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති - ඨානමේතං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා සති වේදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමේතං විජ්ජති. වේදනාපඤ්ඤත්තියා සති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති ඨානමේතං විජ්ජති .......)

මධුපිණ්ඩිකසුත්තං
මජ්ඣිමනිකාය- මූලපණ්ණාසපාළි

**තේරුම :** ''ඇවැත්නි, ඒකාන්තයෙන් හෙතෙමේ ඇස ඇති කල්හි රූපය ඇති කල්හි චක්ඛුවිඥ්ඥානය ඇති කල්හි ස්පර්ශය යැයි පැනවීමක් කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි. ස්පර්ශය යැයි පැනවීමක් ඇති කල්හි වේදනා යැයි පැනවීමක් කරන්නේය යන මේ කාරණය විද්‍යමාන වෙයි.... ''

ලෝකයේ සත්‍යය වශයෙන් නැති ආත්මය, සර්වබලධාරි දෙවියන් වහන්සේ වැනි සිතට හැඟෙන දේ ප්‍රකාශ කරනුයේද වචනවලිනි.

මේ අනුව සත්‍යය වසයෙන් ඇති (පසුකාලීනව පරමාර්ථ) හෙවත් විද්‍යමාන දේවල් පඤ්ඤත්ති හෙවත් නාමකරණය සමඟ විරුද්ධාර්ථ ඇත්තක් නොවේ.

කුසලය අකුසලයට විරුද්ධය. එලෙසින් පරමාර්ථය සම්මුතියට විරුද්ධාර්ථයක් නැත. එසේ නම් විද්‍යමාන හා අවිද්‍යමාන දේ දැක්වීමට පරමාර්ථ සම්මුති කථාවක් පසුකාලීන අභිධර්ම ග්‍රන්ථවල කුමට දැක්වූවාදැයි ඔබට ගැටළුවක් පැන නගිණු ඇත.

පඤ්ඤත්ති යන්නට අර්ථ දෙයාකාරයක් පසුකාලීන යුගයේ බිහිවිය. එකක් නාමකරණය සම්බන්ධවද, අනෙක සැබෑවට නැති අවිද්‍යමානදේ සඳහාය. පුද්ගලපඤ්ඤත්ති ප්‍රකරණයේ අටුවා විස්තරය නුණුවණින් ගැනීමෙන් මෙම විප්‍රකාරයට මග පෑදුණු බව පෙනේ. එම ප්‍රකරණයේ නම ලෙස යෙදෙන පුද්ගලපඤ්ඤත්ති යන පදයේ පඤ්ඤත්ති යන්න තෝරන අටුවා විස්තරය මෙලෙසිනි.

<u>පඤ්චපකරණ-අට්ඨකථා</u>

■ පාළිමුත්තකෙන පන අට්ඨකථානයේන අපරාපි ඡ පඤ්ඤත්තියො - විජ්ජමානපඤ්ඤත්ති, අවිජ්ජමානපඤ්ඤත්ති, විජ්ජමානේන අවිජ්ජමානපඤ්ඤත්ති, අවිජ්ජමානේන විජ්ජමානපඤ්ඤත්ති, විජ්ජමානේන විජ්ජමානපඤ්ඤත්ති, අවිජ්ජමානේන අවිජ්ජමානපඤ්ඤත්තීති. තත්ථ කුසලාකුසලස්සේව සච්චිකට්ඨපරමත්ථවසේන විජ්ජමානස්ස සතෝ සම්භූතස්ස ධම්මස්ස පඤ්ඤාපනා විජ්ජමානපඤ්ඤත්ති නාම. තථා අවිජ්ජමානස්ස ලොකනිරුත්තිමත්තසිද්ධස්ස ඉත්ථිපුරිසාදිකස්ස පඤ්ඤාපනා අවිජ්ජමානපඤ්ඤත්ති නාම. සබ්බාකාරේනපි අනුපලබ්භනෙය්‍යස්ස වාචාවත්ථුමත්තස්සේව පඤ්චමසච්චාදිකස්ස තිත්ථියානං අණුපකතිපුරිසාදිකස්ස වා පඤ්ඤාපනාපි අවිජ්ජමානපඤ්ඤත්තියෙව. සා පන සාසනාවචරා න හොතීති ඉධ න

ගහිතා. ඉති ඉමෙසං විජ්ජමානාවිජ්ජමානානං විකප්පනවසෙන සෙසා වෙදිතබ්බා .............

**තේරුම:** පාලියේ නැති අර්ථකථාවන්හි (හෙළ අටුවා ) එන ආකාරයට තවත් පැනවීම් ආකාර සයක් වෙත්. විද්‍යමානපැනවීම්, අවිද්‍යමානපැනවීම්, විද්‍යමානයෙන් අවිද්‍යමානපැනවීම්, අවිද්‍යමානයෙන් විද්‍යමානපැනවීම්, විද්‍යමානයෙන් විද්‍යමානපැනවීම්, අවිද්‍යමානයෙන් අවිද්‍යමානපැනවීම් ලෙසිනි. එහි කුසල අකුසල ධර්මයන් මෙන් සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් විද්‍යමානවන ඇත්තා වූ හටගන්නා ධර්මයන් (පිළිබඳ) පැනවීම් විද්‍යමානපැනවීම් නම් වේ. එලෙසම විද්‍යමාන නොවන්නා වූ ලෝක ව්‍යවහාර මාත්‍ර වූ ස්ත්‍රිය පුරුසයා වැනි පැනවීම් අවිද්‍යමානපැනවීම් නම් වේ. සියළු ආකාරයෙන් නොලැබිය හැකි , කථාවට පමණක් මාතෘකා වන පස්වැනි සත්‍ය වැනි, අන්‍යතීර්ථකයන්ගේ පරමාණු, ආත්මසාරය (පකති) වැනි දැයෙහි පැනවීම්ද අවිද්‍යමානපැනවීම් නම් වේ. ඒවා වනාහි ශාසනයට අදාළ නැති බැවින් මෙහි නොග න්නා ලදී. මෙසේ විද්‍යමාන අවිද්‍යමානයන්ගේ සුසංයෝග අනුව ඉතිරි ආකාර සතර දැනගතයුත්තේය........

■ අට්ඨකථාමුත්තකේන පන ආචරියනයේන අපරාපි ඡ පඤ්ඤත්තියෝ :- උපාදාපඤ්ඤත්ති, උපනිධාපඤ්ඤත්ති, සමෝධානපඤ්ඤත්ති, උපනික්ඛිත්තපඤ්ඤත්ති, තජ්ජාපඤ්ඤත්ති, සන්තතිපඤ්ඤත්තීති. තත්ථ යෝ රූපවේදනාදීහි එකත්තේන වා අඤ්ඤත්තේන වා රූපවේදනාදයො විය සච්චිකට්ඨපරමත්ථෙ අනුපලබ්භසභාවෝපි රූපවේදනාදිභෙදේ ඛන්ධෙ උපාදාය නිස්සාය කාරණං කත්වා සම්මතො සත්තො. තානි තානි අඞ්ගානි උපාදාය රථෝ ගෙහං මුට්ඨි උද්ධනන්ති ච; තේ තේයේව රූපාදයෝ උපාදාය ඝටෝ පටෝ; චන්දසූරියපරිවත්තාදයෝ උපාදාය කාලෝ, දිසා; තං තං භූතනිමිත්තඤ්චේව භාවනානිසංසඤ්ච උපාදාය නිස්සාය කාරණං කත්වා සම්මතං තේන තේනාකාරේන උපට්ඨිතං උග්ගහනිමිත්තං පටිභාග නිමිත්තන්ති අයං ඒවරූපා උපාදාපඤ්ඤත්ති නාම. <u>පඤ්ඤපෙතබ්බට්ඨෙන චෙසා පඤ්ඤත්ති නාම, න පඤ්ඤාපනට්ඨෙන. යා පන තස්සත්ථස්ස පඤ්ඤාපනා, අයං අවිජ්ජමානපඤ්ඤත්තියේව.</u>

**තේරුම :** අර්ථකථාවේද නැති නමුත් ආචාර්ය මතයට අනුව තවත් පැනවීම් ආකාර සයක් වෙත්. උපාදාපැනවීම්, උපනිධාපැනවීම්, සමෝධානපැනවීම්, උපනික්ඛිත්තපැනවීම්, තජ්ජාපැනවීම්, සන්තතිපැනවීම් යනුවෙනි. එහි යම් රූප වේදනා ආදී ධර්මයන් මෙන් ඒකාන්ත ලෙස හෝ අන්ආකාරයකින් හෝ සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් නොලැබෙන නමුත් රූප වේදනා ආදී ලෙස බෙදීගිය ස්කන්ධයන් ඇසුරු කොට, ඒවා මත පිහිටා, එය කාරණය කොට සම්මත වූ සත්වයා, ඒ ඒ අංග කරණ කොට සම්මත වූ රථය, ගෙය, මිට, ලිප, යනාදියද, ඒවාම නිසා කළය, කොඩිය වැනි දෑද, සඳහිරුගේ කරකැවීම කරණ කොට (සම්මත වූ) කාලය, දිසා වැනි දෑයද, (තවද) ඒ ඒ සතරමහාභූත නිමිතිත්, භාවනා ආනිසංසත් නිසා ඒවා ඇසුරු කොට, මත පිහිටා එය කරුණු කොට සම්මත වූ ඒ ඒ ආකාරයෙන් එළඹ සිටින උග්ගහනිමිත්ත පටිභාග නිමිත්ත යනාදියත්, මෙසේ මෙම ආකාරයෝ උපාදාපැනවීම් නම් වේ. <u>පැනවියයුතු අර්ථයෙන් ඒවා පඤ්ඤත්ති නම් වේ. පනවන අර්ථයෙන් නොවේ. යම් වනාහි එම අර්ථයන්හි පැනවීමක් (ඇත්ද) එය අවිද්‍යමානපැනවීම්ම වේ.</u>

---

පඤ්චපකරණ අට්ඨකථාව අභිධර්මයේ අවසාන ප්‍රකරණ පහ සඳහා වූ අට්ඨකථාවයි. මෙය සම්පාදිත වූයේ බුද්ධඝෝෂ හිමියන් විසිනි. බුද්ධවර්ෂ 950 දී පමණය. ඊට පෙර යුගයේ තිබූ අට්ඨකථා කිහිපයක් පදනම් කර ගෙන මෙම අට්ඨකථා සැකසිණි. අභිධර්ම පිටකයේ පුග්ගලපඤ්ඤත්තිප්‍රකරණයේ ස්කන්ධපඤ්ඤත්ති, ආයතනපඤ්ඤත්ති, ධාතුපඤ්ඤත්ති, සච්චපඤ්ඤත්ති, ඉන්ද්‍රියපඤ්ඤත්ති, පුග්ගලපඤ්ඤත්ති යනාදී වසයෙන් සයාකාර පැනවීමක් ගැන සඳහන් වේ. පාලි පෙළට අමතරව පඤ්චපකරණ අට්ඨකථාවට පදනම් වූ පෙර අටුවාවක තිබූ සයාකාරක පැනවීම් ගැනද බුදුගොස් හිමියන් මෙහිදී දක්වයි.

නාමකරණය ප්‍රභේද කිරීමක් මෙම ඡේද වලින් දැක්වේ. විද්‍යමාන දේවල් සඳහා වූ නාමකරණය විද්‍යමානපැනවීම්ද (විජ්ජමානපඤ්ඤත්ති) අවිද්‍යමානය සඳහා නාමකරණය අවිද්‍යමානපැනවීම් ලෙසද දැක්වේ. මෙතනදී සිදුවී ඇත්තේ නාමකරණය ගැන නාමකරණයකි. භාෂාවේ විවිධ වචන ගැන හඳුන්වාදීමකි. වචනවලින් හැඟෙන දේ සළකාගෙන වචන නිර්වචනය කිරීමකි.

මේ අනුව රූප, වේදනා, සංඥා ආදි වචන විද්‍යමානපැනවීම් ලෙසටද ස්ත්‍රිය, පුරුෂයා, පුද්ගලයා ආදි වචන අවිද්‍යමාන පැනවීම් ලෙසද දැක්වේ. විද්‍යමාන අවිද්‍යමාන සුසංයෝග සළකා ගෙන තවත් ආකාර සතරක් දක්වා තිබේ. මීට අමතරව ආචාර්ය පරම්පරාවෙන් ආ තවත් ආකාර සයක් ගැන අවසාන ඡේදයෙන් දැක්වේ. උපාදාපඤ්ඤත්ති, උපනිධාපඤ්ඤත්ති යනාදි වශයෙන් දක්වා ඇත්තේ එම ආචාර්ය මතයයි. සියල්ලම ගත්විට පැනවීම් ආකාර දහඅටක් දක්වා ඇත.

මුල් ඡේදයෙන් දක්වන ආකාර සය කෙසේ වෙතත් අවසානයේ දැක්වෙන උපාදාපඤ්ඤත්ති ආදිය ගැන කියවන පාඨකයාට ඒවා නාමකරණය ගැන නාමකරණයක්ද, නැතහොත් සිත සමග ඇතිවන හැඟීමක්ද, එසේත් නැත්නම් සිතට අරමුණුවන, හැඟෙන දෙයක් දැයි නිශ්චය නොවේ. වචනය සමග වචනයේ අර්ථයද බැඳී ඇත. දන්නා භෂාවකින් යමක් අසන විට එහි අර්ථයද සිතට නැඟේ.

උපාදා ආදි පඤ්ඤත්ති ගැන ඇති විස්තරය අවසානයේ ඒවා අවිද්‍යමානපඤ්ඤත්ති ලෙසද දක්වා ඇත. එය නාමකරණය සම්බන්ධව බව පැහැදිලිය. නමුත් එම ඡේදයේ අග කොටසේ එන ''<u>පඤ්ඤපෙතබ්බට්ඨෙන චෙසා පඤ්ඤත්ති නාම''( පැනවියයුතු(දෙය) යන අර්ථයෙන් ඒවා පඤ්ඤත්ති නම් වේ) ''</u> යන වැකියෙන් පඤ්ඤත්ති වචනයේ තවත් අර්ථයක් දනවයි.

අභිධර්මාර්ථ සංග්‍රහය වැනි මෑතකාලීන කෘතිවල දෙයාකාරයකට පඤ්ඤත්ති විග්‍රහ කිරීමට මෙම වැකිය මූලාරම්භයක් සැපයූ බවක් පෙනේ.

ගෙවල්, දොරවල්, ඇඳ, පුටු, මේස, යාන, වාහන ආදී රූපාකාරද සත්වයා පුද්ගලයා, ස්ත්‍රිය, පුරුෂයා යනාදියද අවිද්‍යමාන ලෙස අටුවාවේ දක්වා ඇති දෙයට උදාහරණය. සත්වයා පුද්ගලයා යනාදිය කෙසේ වෙතත් ඇඳ, පුටු, මේස, යාන, වාහන ආදී රූපාකාර අවිද්‍යමාන දේ ලෙස දැක්වීම වෙනම විග්‍රහ කළයුතුය.

මෙලෙසින් අවිද්‍යමාන ලෙස අදහස්කළ දේවලට කළ, නාමකරණයේ නාමකරණය අවිද්‍යමානපඤ්ඤත්ති විය. නාමකරණයේ නාමකරණය එයින් අදහස් කළ දේ සමග පැටලී අවිද්‍යමානය සඳහා අවිද්‍යමානපඤ්ඤත්ති යන්නද පසුකාලීනව අවිද්‍යමාන කොටස ලොප්වී පඤ්ඤත්ති යන්නද සමහර ආචාර්යවරු භාවිතා කිරීමට පටන් ගත්හ. මෙයින් වූයේ පටලැවිල්ලකි.

උදාහරනයක් ලෙස බූරුවා යන වචනය සළකාගන්න. මෙම වචනය ගැන අපට අර්ථකතන කළහැක. එනම් මෙය සතෙකුට යොදන වචනයකි. සිංහල භාෂාවේ වචනයකි. නාමපදයකි යනාදී වශයෙනි. එම සතුන් සිටින ගොවිපොළක මිනිසෙක් එම සතුන් ගැන කථාකිරීමට අවශ්‍ය වූවිට බූරුවා යන වචනය යොදනවා මිස නාමපදය ගාල්කරා හෝ සිංහල භාෂාවේ වචනය ගාල්කරා යැයි කියන්නේ නැත. ඉහත සඳහන් කළ පටලැවිල්ලෙන් සිදුවූයේ මෙවන් දෙයකි.

මෙලෙස පරමාර්ථයේ විරුද්ධාර්ථය හැඟෙන වචනයක් ලෙස පඤ්ඤත්ති යනවචනය යෙදීම ආරම්භ විය. මෑත කාලයේ පරමාර්ථ සම්මුති කථාවක් ගොඩනැගුනේ මෙලෙසිනි. ඇත්තෙන්ම ත්‍රිපිටකගත අභිධර්මයේ පරමාර්ථ-සම්මුති කථාවක් කිසිම අයුරකින් සඳහන් නොවේ. අවිද්‍යමානපඤ්ඤත්ති වචනය නිසා අවිද්‍යමානයට පඤ්ඤත්ති යනුවෙන් යොදනවා නම්

විද්‍යමානපඤ්ඤත්ති වචනය නිසා විද්‍යමානයටද පඤ්ඤත්ති යැයි යෙදිය හැක. එවිට පරමාර්ථයද පඤ්ඤත්තියක් වනු ඇත.

ඇත්තෙන්ම මෙම විකෘතිය වචන අතර පටලැවිල්ක් පමණක් නොවේ. පසුව මෙය විදර්ශනා භාවනාව නොමග යැවීමටද බලපෑවේය. එම බලපෑ ආකාරය පසුව විස්තර කොට ඇත. මෑතකාලයේ අභිධර්ම පොත්වලින් අභිධර්මය ඉගෙනගත් යෝගාවචරයින්ට මෙය විශේෂයෙන් බලපෑවේය. පඤ්ඤත්ති යන්නට අර්ථ දෙයාකාරයක් යෙදීම ගැන අභිධර්ම මූලටීකාව ලියැවුණු යුගයේද ආචර්යවරුන් අතර මතභේදයක් හටගෙන තිබුණු බව පෙනේ. අභිධර්ම මූලටීකාව ලියූ වනරථන ආනන්ද තෙරුන් මෙම දෙයාකාරයක් යෙදීම ගැන පිටු ගණනක විවරණයක් කොට එහි සාවද්‍ය බව දක්වා ඇත. එම විවරණයේ සුළු කොටසක් පහත දක්වා ඇත.

## ධම්මසඞ්ගණී-මූලටීකා

( දුවිධා චායං පඤ්ඤත්ති යථාවුත්තප්පකාරාති අට්ඨකථාවචනඤ්ච න දිස්සති. අට්ඨකථායං පන විජ්ජමානපඤ්ඤත්තිආදයො ඡ පඤ්ඤත්තියෝව වුත්තා. තත්ථ ''රූපං වෙදනා'' ති ආදිකා විජ්ජමානපඤ්ඤත්ති. ''ඉත්ථිපුරිසො'' ති ආදිකා අවිජ්ජමානපඤ්ඤත්ති.''තෙවිජ්ජො ඡළභිඤ්ඤො'' ති ආදිකා විජ්ජමානේන අවිජ්ජමානපඤ්ඤත්ති. ''ඉත්ථිසද්දො පුරිසසද්දො'' ති ආදිකා අවිජ්ජමානේන විජ්ජමානපඤ්ඤත්ති. ''චක්ඛුවිඤ්ඤාණං සෝතවිඤ්ඤාණං'' න්ති ආදිකා විජ්ජමානේන විජ්ජමානපඤ්ඤත්ති. ''ඛත්තියකුමාරෝ බ්‍රාහ්මණකුමාරෝ'' තිආදිකා අවිජ්ජමානේන අවිජ්ජමානපඤ්ඤත්ති. න ච එත්ථ යථාවුත්තප්පකාරා දුවිධා පඤ්ඤත්ති වුත්තාති සක්කා විඤ්ඤාතුං. විජ්ජමානස්ස හි සඞ්ඛා ...පෙ... අභිලාපෝ විජ්ජමානපඤ්ඤත්ති. අවිජ්ජමානස්ස ච සඞ්ඛාදිකා අවිජ්ජමානපඤ්ඤත්ති. තේසංයෙව විසේසනවිසේසිතබ්බභාවේන පවත්තා සඞ්ඛාදයො ඉතරාති )

පඤ්ඤත්ති යන්නට අර්ථ දෙයාකාරයක් අට්ඨකථාවේද සඳහන් නොවූ බව ආනන්ද හිමියන් දක්වයි. ත්‍රිපිටකයේ ඍජුවම ඇති කරුණු සැළකීමේදී එවන් අර්ථ දෙයාකාරයක් අටුවාචාරීන්

වහන්සේ අදහස් කළා යැයි සිතිය නොහැකිබවද මූලටීකා විවරණය තුළ පසුව දැක්වේ. අටුවාව තුළ විජ්ජමානපඤ්ඤත්ති අවිජ්ජමානපඤ්ඤත්ති ආදි ලෙසින් දැක්වූයේ නාමකරණයේ ප්‍රභේදයන් පමණක් බව ඉහත ඡේදයෙන් විස්තර වේ.

එනමුත් අභිධර්මාර්ථ සංග්‍රහය සම්පාදනය කිරීමේදි ඉහත සදොස් ක්‍රමය අනුගමනය කළබව පෙනේ. අභිධර්මාර්ථ සංග්‍රහය, ටීකා හෝ ඊට පසු යුගයේ ලියැවුණු පොතකි. එය පදනම් කොට මෑතකාලයේ බොහෝ අභිධර්ම පොත් සම්පාදනය වී ඇත. රේරුකානේ චන්දවිමල මහනාහිමියන්ගේ අභිධර්ම කෘතිවලටද දෙයාකාරයක පඤ්ඤත්තියක් පැමිනියේ, එය අභිධර්මාර්ථ සංග්‍රහය ඇසුරු කළබැවින් යැයි හැඟේ. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි පඤ්ඤත්තිභේදය නැමැති මතෘකාව යටතේ එන විස්තරය පහත දැක්වේ.

1. තතෝ අවසේසා පඤ්ඤත්ති පන පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති, පඤ්ඤාපනතෝ පඤ්ඤත්තීති ච දුවිධා හොති.

(පඤ්ඤත්ති වනාහි පැනවෙන හා පනවන ලෙස දෙයාකාර වේ.)

2. කථං? තංතංභූතවිපරිණාමාකාරමුපාදාය තථා තථා පඤ්ඤත්තා භූමිපබ්බතාදිකා, සම්භාරසන්නිවේසාකාරමුපාදාය ගේහරථසකටාදිකා, ඛන්ධපඤ්චකමුපාදාය පුරිසපුග්ගලාදිකා, චන්දාවට්ටනාදිකමුපාදාය දිසාකාලාදිකා, අසම්ඵුට්ඨාකාරමුපාදාය කූපගුහාදිකා, තංතංභූතනිමිත්තං භාවනාවිසෙසඤ්ච උපාදාය කසිණනිමිත්තාදිකා චේති එවමාදිප්පභේදා පන පරමත්ථතෝ අවිජ්ජමානාපි අත්ථච්ඡායාකාරේන චිත්තුප්පාදානමාරම්මණභූතා තං තං උපාදාය උපනිධාය කාරණං කත්වා තථා තථා පරිකප්පියමානා සඞ්ඛායති සමඤ්ඤායති වෝහරීයති පඤ්ඤාපීයතීති පඤ්ඤත්තීති පවුච්චති. අයං පඤ්ඤත්ති පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති නාම.

(කෙලෙසද යත්? ඒ ඒ සතරමහා භූතයන්ගේ විවිධාකාර කරණ කොට ගෙන ඒ ඒ අයුරින් පැනවෙන භූමිපර්වත ආදියද, සාමූහික

එක්රැස්වූ ආකාර කරණකොට ගෙවල්, වාහන, කරත්ත, ආදියද, ස්කන්ධ පංචකය කරණකොට පුරිසපුද්ගලාදියද, චන්ද්‍රයාගේ කැරකීම ආදි කරණකොට පැනවෙන දිසා කාල ආදියද, ස්පර්ෂ නොවීම කරණකොට වළවල් ගුහාදියද, ඒ ඒ භූතනිමිතිත් භාවනාවේ විශේෂිත ආකාරත් කරණකොට කසිණනිමිති ආදියද, මෙසේ ප්‍රකාර වූ පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වුවද අර්ථඡායාවක් ලෙසින් උපදින සිතට අරමුණුවූද, ඒ ඒ දේ කරණ කොට ඒ ඒ දේ මත පිහිටා ඒ ඒ අයුරින් පරිකල්පනය කරන්නාවූ සළකාගන්නාවූ ව්‍යවහාර කරන්නාවූ පැනවෙන්නාවූ යයිද පඤ්ඤත්තිය වේ යයි කියනු ලැබේ. මෙම පඤ්ඤත්ති පැනවෙන බැවින් පඤ්ඤත්ති යනු වේ.)

3. පඤ්ඤාපනතෝ පඤ්ඤත්ති පන නාමනාමකම්මාදිනාමේන පරිදීපිතා, සා විජ්ජමානපඤ්ඤත්ති අවිජ්ජමානපඤ්ඤත්ති, විජ්ජමානේන අවිජ්ජමානපඤ්ඤත්ති, අවිජ්ජමානේන විජ්ජමානපඤ්ඤත්ති, විජ්ජමානේන විජ්ජමානපඤ්ඤත්ති, අවිජ්ජමානේන අවිජ්ජමානපඤ්ඤත්ති චේති ඡබ්බිධා හොති.

(පනවන අයුරින් පඤ්ඤත්ති වනාහි නම්, නම්කිරීම් ආදිනාමයෙන් දැක්වෙනු ලැබේ. ඒවා විද්‍යමානපැනවීම්, අවිද්‍යමානපැනවීම්, විද්‍යමානයන් අවිද්‍යමානපැනවීම් ......ලෙසින් සයාකාර වේ.)

ඉහත අංක 2 ඡේදයේ ''**චිත්තුප්පාදානමාරම්මණභූතා**'' ලෙස '' **අර්ථඡායාවක් ලෙසින් උපදින සිතට අරමුණුවූද** '' අයුරින් පරිවර්තනය වී ඇති කොටස වෙත පාඨකයින් වඩාත් අවධානය යොමු කළයුතුය. නාමකරණයට අමතරව සිතට ආරම්මණයක් ලෙස පඤ්ඤත්ති කියා දෙයක් ඉහත දැක්වෙයි. එයින් අදහස් කරන්නේ ගෙයක්, පුටුවක්, මිනිසෙක්, වැනි දෙයක් ගැන සිතන විට කෙනෙකුට සාමාන්‍යයෙන් අරමුණු වනුයේ පඤ්ඤත්තියක් බවයි.

## විදර්ශනාවට බලපාන ආකාරය

චිත්ත චෛතසිකයන්ගේ අනිත්‍යතාව මෙනෙහි කිරීම විදර්ශනාවේ මූලික කාර්යයකි. ඊට පෙර චිත්තය හෙවත් විඤ්ඤාණය කුමක් දැයි හඳුනා ගතයුතුය. සිංහලෙන් දැනීම කියනුයේ විඤ්ඤාණයටය. විවිධ විෂයන් ඔස්සේ විවිධාකාර දැනීම් හටගනී. විෂයට අරමුණ යැයිද කියනු ලැබේ. අරමුණෙන් තොරව විඤ්ඤාණය විස්තර කළ නොහැක. විඤ්ඤාණයේ විවිධත්වයට ප්‍රධාන ලෙසම අරමුණෙහි විවිධත්වය බලපායි. මේ නිසා සිතේ විවිධත්වය දක්වනු වස් අභිධර්මයේදි නිතර ආරම්මණ ප්‍රභේද කොට දක්වනු ලැබේ.

ධර්මසංගණීප්‍රකරණයේ පළමු කුසල සිත හැඳින්වීමේදීද "රූපාරම්මණං වා සද්දාරම්මණංවා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා" යනුවෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස හා ධර්ම ලෙසින් අරමුණුවල විවිධත්වය දක්වා ඇත්තේ එනිසාය. අරමුණු පිළිබඳ පුළුල් දැනුමක් ඇතිකරලීමට පට්ඨානයේ ආරම්මණ ප්‍රත්‍යය ගැන සඳහන් කොටසක් පසුව දැක්වේ.

ඉහත ධම්මාරම්මණය අර්ථදැක්වීමට යාමේදීද පසුකාලීන අභිධර්ම පොත්වල පටලැවිල්ලක් සිදුවිය. අභිධම්මාර්ථසංග්‍රහයෙහිද ඊට අනුගතව ගිය සියළු ග්‍රන්ථවලද ධම්මාරම්මණ ප්‍රභේදය දැක්වෙනුයේ මෙලෙසිනි,

''ආරම්මණානි නාම රූපාරම්මණං සද්දාරම්මණං ගන්ධාරම්මණං රසාරම්මණං ඵොට්ඨබ්බාරම්මණං ධම්මාරම්මණඤ්චෙති ඡබ්බිධානි භවන්ති. තත්ථ රූපමේව රූපාරම්මණං, තථා සද්දාදයෝ සද්දාරම්මණාදීනි. ධම්මාරම්මණං පන පසාද, සුඛුමරූප, චිත්ත, චෛතසික, නිබ්බාන, පඤ්ඤත්ති, වසේන ඡධා සඞ්ගය්හති.''

අභිධම්මාර්ථසංග්‍රහය

ආරම්මණ රූප, සද්ද, ගන්ධ, රස, පහස, ධර්ම ලෙස සයාකාරවන බවත් එම ධම්මාරම්මණය ප්‍රසාද, සුඛුමරූප, චිත්ත, චෙතසික, නිබ්බාන, පඤ්ඤත්ති, වසයෙන් සයාකාරව සංග්‍රහ වන බවත් ඉහත දැක්වේ. එනමුත් ත්‍රිපිටකයේ කිසිම තැනක ධම්මාරම්මණයේ කොටසක් ලෙස පඤ්ඤත්ති කියා දෙයක් දක්වා නැත.

අභිධර්ම පිටකයේ, විභංගප්‍රකරණයේ ඣ්‍යාන සිත් ආකාර විස්තරවන තැන්වල, ඒවායේ අරමුණු සම්බන්ධව දැක්වීමේදී, '' **න වත්තබ්බාරම්මණ** '' ලෙස තුන් කාලයට නොගැණෙන අරමුණු ප්‍රබේදයක් දක්වා ඇත. උදාහරණයක් ලෙස නීලකසිණය අරමුණු කොට කෙනෙක් ඣ්‍යානයට සම වැදුනහොත්, එම අරමුණුවන නිල් පැහැය සැබෑවටම ලොකයේ හටගත් ධර්මයක් නොවේ. එම ආරම්මණය අතීත අනාගත හෝ වර්තමාන යන තුන් කාලයටම අදාළ නොවේ. ඒනිසා එය තුන් කාලයට අදාළව ''**නොකිවයුතුයි** '' යන අරුතින් '' **න වත්තබ්බාරම්මණ** '' ලෙස දැකවේ. නමුත් එය රූපමය ආරම්මණයකි. (පටිසම්භිදාමග්ගයේ දිට්ඨි කථාවල ''රූපය ආත්මය ලෙස '' දක්නා අවස්ථාවලට උදාහරණයක් ලෙස කසිණ ආරම්මණ දක්වා ඇත.)

එවන් අවස්ථා සඳහා පසුකාලීන තෙරවරු පඤ්ඤත්ති ආරම්මණ ලෙස දැක්වූ බවක් පෙනේ. මෙම පටලැවිල්ලේ මූලාරම්භයක් එලෙස වූ බව අපගේ අදහසයි. එනමුත් ඒ ගෙවල්, දොරවල්, ස්ත්‍රි, පුරුෂ ආදිය සඳහා නොවේ. පෙර සඳහන් කළ, ඣ්‍යාන සිතට අරමුණුවන නිල් පැහැය අනිත්‍යද කියා ඇසුවහොත්, එය සැබෑවට හටනොගන්නා ධර්මයක් නිසා, එහි නැති වී යාමක් නොපැනවෙන බවකි කිව යුත්තේ. එනමුදු කිසි ලෙසකින් එය නිත්‍ය දයෙක් නොවේ.

මෙසේ අනිත්‍ය ලෙස නොගැනෙන බැවින්, සමහරක් ථේරවාද අභිධර්ම ග්‍රන්ථවල පඤ්ඤත්ති, අසංඛත පක්ෂය භජනය කරනබවට දැක්වෙයි. ඊටත් පසු යුගයේ පඤ්ඤත්ති යන්න,

ගෙවල්, දොරවල්, ස්ත්‍රී, පුරුෂ ආදිය සඳහාත් ව්‍යාප්ත වූ නිසා ( අභිධම්මාර්ථසංග්‍රහයෙහි මෙන් ) ඒවාද අනිත්‍ය ලෙස නොකිවයුතු යැයි පටලැවිල්ල උඩුඳුවා ගියේය. අසංඛත ලක්ෂණය දරණුයේ නිවන පමණකි.

ගෙවල්, දොරවල්, ඇඳ, පුටු, මේස, යාන වාහන ආදී රූපාකාරද සත්වයා, පුද්ගලයා, ස්ත්‍රිය පුරුෂයා යනාදි අවිද්‍යමාන යැයි පසුකාලීනව අදහස් කළ දේවල් පඤ්ඤත්ති ලෙස දැක්වූ බව ඉහත සඳහන් කරන ලදී. ධම්මාරම්මණයේ කොටසක් පඤ්ඤත්ති වන විට ඇඳ, පුටු, මේස, යාන, වාහන ආදි පඤ්ඤත්තීන් අරමුණු කොට චිත්ත, චෛතසික පහළ වන බවට පසුකාලීන අභිධර්මය හදාරන පාඨකයාට හැඟේ.

රූපාරම්මණයක් ඔස්සේ ඇඳ, පුටු, මේස ආදිය ඒවා ලෙසින් දැන හැඳිනම් උපදිනවා විනා ඇඳ, පුටු, මේස, යාන, වාහන ආදිය අරමුණු කොට චිත්ත, චෛතසික උපදිනවා යැයි කීම දොස් සහිතය.

පටිච්චසමුත්පාදය පිළබඳ සියුම් අනවබෝධයක් නිසා මෙම වරද සිදුවේ. වර්ණ රූප පරාසය ඔස්සේ මේසයක්, පුටුවක්, මිනිස් සිරුරක්, ලෙසින් ගොනුකරගැනීම විඤ්ඤාණයේ කෘත්‍යය වේ. එහි දිග, පළල, ඝනකම, යාබද වස්තූන් සමඟවන පරතරය පිළිබඳ දැනුමද විඤ්ඤාණයමය. යම් මොහොතක ගොනුවන විෂය පරාසයට පිටතින් ඒ මොහොතේ හටගන්නා විඤ්ඤාණය අර්ථදැක්විය නොහැක. අරමුණ විඤ්ඤාණය නොවූවත් අරමුණෙන් පරිබාහිරව විඤ්ඤාණය විස්තර කළ නොහැක. වෙනත් විදියකට පැවසුවහොත් යමක් දැනෙන විට ජීවත්වීමේ ප්‍රධාන කොටස එම මොහොත තුළය.

එකම අවස්ථාව තුළ දැනුවත් වන දේ විඳිමින් හඳුනාගනිමින් විඤ්ඤාණ සංඥා වේදනා ආදි මානසික ධර්ම එක්ව හටගෙන එක්ව බිඳී යයි. මේ කරුණු පිළිබඳ නොදැනීමත් අභාවිත මනසත් නිසා

ග්‍රාහ්‍ය ග්‍රාහක භේදය හටගනී. සිතට යමක් දැනුනා, මම මේ දේ දැක්කා යැයි සාමාන්‍ය මිනිසුන් කියනුයේ පටිච්චසමුත්පාදය පිළිබඳ ඉහත දක්වන ලද කාරණය ගැන අනවබෝධයෙනි. පඤ්ඤත්තිය සිතට අරමුණු වනවා යැයි කීමේ දෝෂය දැන් පැහැදිලි ඇතැයි සිතමි.

ඇඳ, පුටු, මේස, යාන, වාහන ආදි තමන් අවට පරිසරය සිතට අරමුණු වනවා යැයි කීවිට මගහැරී යන්නේ එම අවස්ථාවේ හටගත් විඤ්ඤාණ හා සංඥාය. මෙවිට එදිනෙදා ඇතිවන විඤ්ඤාණ හා සංඥා ගැන අනිත්‍ය මෙනෙහි කිරීම මගහැරී යයි. තවත් උදාහරණයක් ලෙස සක්කාය දිට්ඨිය ඇතිවන අවස්ථාවක් ගනිමු. එවන් අවස්ථාවක නාම රූපපධර්මයන් කෙරෙහි (එවා අරමුණු කොට) මෙය මගේ ආත්මය යැයි හැඟීමක් හටගනී. නමුත් ආත්මය අරමුණු කොට සක්කායදිට්ඨිය ඇතිවූවා යැයි අප කියන්නේ නැත. එසේම රූප අරමුණක් ඔස්සේ සුරතල් සතෙක් යැයි දැන හඳුනා ගනිමින් ඇල්මක් හටගනී. එසේ නොමැතිව සුරතල් සතා අරමුණු කොට කෙළෙස් ඇතිවනවා කීම ගැඹුරු ලෙස දහම් විග්‍රහයේදී එතරම් සුදුසු නොවේ.

නමුත් භාෂා ව්‍යවහාරයේදී මෙවැනි යෙදුම් පාවිච්චි කිරීමට සිදුවේ. අසන්නාගේ මට්ටමද සැළකිය යුතුය. සාමාන්‍ය මිනිසුන් අතර ගොඩනැගුනු භාෂාව ගැඹුරු දහම් කීමට යොදාගැනීමේදි ඇතිවන දුෂ්කරතාවයද සැළකිල්ලට ගත යුතුය. මෙවන් පසුබිමක බුදුරජාණන් වහන්සේ අභිධර්ම දේශනාවේදි ඒ ඒ සිත් අර්ථදක්වා ඇති ආකාරය අතිවිශිෂ්ටය.

පටිසම්භිදාමග්ගයේ දිට්ඨි කථාවල විසි ආකාර සක්කායදිට්ඨියට අරමුණු ලෙස දක්වා ඇත්තේ රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ ආදියය. සතිපට්ඨානයේ දුක්ඛසමුදය නිද්දේසයද මීට උදාහරණයකි. " චක්ඛුං ලෝකේ පියරූපං සාතරූපං..." ලෙසින් තණ්හාවට අරමුණු ලෙස දක්වා ඇත්තේද විද්‍යමාන සැබෑ දේවල්ය.

අංගුත්තර නිකායේ නවක නිපාතයේ සමිද්ධි සූත්‍රයේ මීටම සම්බන්ධ වැදගත් කරුණක් හමුවේ. සැරියුත් හිමියන් එහිදී කුමක් අරමුණු කොට සංකල්ප විතර්කයෝ උපදිත්දැයි සමිද්ධි හිමියන්ගෙන් විමසන ලදුව, ''නාම රූප අරමුණු කොට ස්වාමීනි'' යැයි පිළිතුරු ලබාදෙයි. නමුත් පසුකාලීන අභිධර්මය හැදෑරූ අයෙකු එම පැනයට '' **පඤ්ඤත්ති අරමුණු කොට ස්වාමීනි** '' යැයි පිළිතුරු ලබාදෙනු ඇත.

තවත් අනේකවූ සූත්‍ර පද විමසීමෙන් මෙය සනාථ කරගතහැක. පසුව දක්වා ඇති පට්ඨානයේ ආරම්මණ ප්‍රත්‍යයට අදාළ කොටස අධ්‍යයනයෙන්ද සැක දුරු කරගත හැකිවනු ඇත.

අටුවාචාරීන් වහන්සේ ඉහත කරුණ දැන නොසිටියා යැයි කිව නොහැක. මීට සාක්ෂියක් සම්මෝහවිනෝදනී නම්වූ විබංග අට්ඨකථාවෙහි ඇත. විබංගප්පකරණයෙහි සික්ඛාපද විබංගහි පංචසික්ෂා පද (පංසිල්) විස්තර කොට ඇත. සතෙකු මැරීමෙන් වැළකීමට කෙනෙකු සිතන විට, ඔහුගේ සිතේ ආකාරය, එම සිත ගන්නා අරමුණ යනාදිය එහි විස්තර වේ.

පංසිල් ''**පච්චුප්පන්න ආරම්මණා** '' ලෙසින් '' **වර්තමානාය් හටගත් ධර්ම අරමුණු කොට පවත්නේ යැයි**'' එහි සඳහන් වේ. එකරුණ විග්‍රහ කරන බුදුගොස් හිමියන්, '' **සත්වයෙකු අරමුණු කොට යැයි පෙර සඳහන් වුවද, ඇත්තෙන්ම සංස්කාර අරමුණු කොට එවිට සිත පවත්නේ යැයි**'' සඳහන් කරයි.

**(ආරම්මණතිකේසු පන යානි සික්ඛාපදානි එත්ථ සත්තාරම්මණානීති වුත්තානි, තානි යස්මා සත්තෝති සඞ්ඛං ගතේ සඞ්කාරේයේව ආරම්මණං කරොන්ති, යස්මා ච සබ්බානිපි ඒතානි සම්පත්තවිරතිවසේනේව නිද්දිට්ඨානි, තස්මා ''පරිත්තාරම්මණාති'' ච ''පච්චුප්පන්නාරම්මණාති'' ච වුත්තං.)**

සම්මෝහවිනෝදනී අටුවා

සරළව කිවහොත් ඉහත අදහස් කරන්නේ, සතෙකු හෝ මිනිසෙකු ගැන කෙනෙකු දැනුවත්වන විට, සිතෙහි අරමුණ වනුයේ, සත්ව පඤ්ඤත්තියක් කියා අමුතු දෙයක් නොව, සත්වයෙකුට අදාළ නාම-රූප ධර්මයන්ය. එනම් සංස්කාරමය.

සම්මුති හෙවත් පඤ්ඤත්ති අනිත්‍ය නොවන බවටත් සකස් නොවූ අසංඛත පක්ෂය භජනය කරන බවටත් මිථ්‍යා අදහසක් පසුකාලීනව මුල් බැස ගැනීමට තවත් කරුණක් බලපෑවේය. නාමකරණය සඳහාත් අවිද්‍යමානය සඳහාත් පසුකාලීනව පඤ්ඤත්ති යන වචනය භාවිතා වූ බව පෙර දක්වන ලදී. නාමකරණය හෙවත් භාෂා ව්‍යවහාරය සකස් වු දෙයක් බවත් අනිත්‍යතාවයෙන් නොමිඳුනු දෙයක් බවත් පෙර දක්වන ලදී. බොහෝ ඈත අතීත බුදුවරුන්ගේ නම්ගම් වර්තමානයේ භාවිත වීම හේතුකොට නාමකරණය අනිත්‍ය නොවේ යැයි සමහර අටුවාවල සඳහන්වීම පුදුම සහගතය.

**''භගවා එතදවොච - ධාතුනානත්තං, භික්ඛවෙ, පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං .....**

**සඤ්ඤානානත්තසුත්‍රය -නිදානසංයුක්තය**

**''කතමෝ ච, භික්ඛවේ, සඤ්ඤානං විපාකෝ? වොහාරවෙපක්කං භික්ඛවේ, සඤ්ඤං වදාමි. යථා යථා නං සඤ්ජානාති තථා තථා වොහරති, එවං සඤ්ඤී අහෝසින්ති. අයං වුච්චති, භික්ඛවේ, සඤ්ඤානං විපාකෝ.''**

**නිබ්බෙධිකසුත්තං-අඞ්ගුත්තරනිකාය -ඡක්කනිපාතපාළි**

ඉහත උධෘත සූත්‍ර පාඨ දෙකින් කියවෙන්නේ ධාතුන්ගේ නානාආකාරය නිසා නානාආකාර වූ සඤ්ඤා හටගන්නා බවත් සඤ්ඤාවේ විපාකය ව්‍යවහාරය බවත්ය. යම් යම් යම් අයුරකින් හඳුනාගන්නේද ඒ ඒ අයුරින් ව්‍යවහාර කරන බවත්ය. ව්‍යවහාරය යනු සකස් වන දෙයක් බව මේ තුළින් පැහැදිලිය. සඤ්ඤාවේ අනිත්‍යතාවය ව්‍යවහාරයේ නැතිවී යාමට බලපානු ඇත.

පඤ්ඤත්තියේ අනික් ආකරය වූ අවිද්‍යමානය අනිත්‍ය නොවේ යැයි කීවේ සූක්ෂම රූපාකාර හඳුන්වාදීමකිනි. යාන, වාහන, ගෙවල්, දොරවල් සබෑවට නැති බවත් ඉතා සියුම් රූපකලාප සමූහයක එකතුවක් පමණක් බවටත් පසුකාලීන අභිධර්මය ලෙසින් වන ඉගැන්වීමක් ඇත. පසුකාලීනව නිතර භාවිතා වන මෙම රූපකලාප වචනය පවා මුළු ත්‍රිපිටකය තුළම කිසිම තැනක දක්නට නැතැයි කීවිට සමහරුන් මවිතයට පත්වේ. මෙසේ යාන වාහන ගෙවල් ආදිය සැබෑවට නැති නිසා ඒවා අනිත්‍ය යැයි කිව නොහැකි බව පැවසේ. මේ නිසා යෝගාවචරයන් රූපයේ අනිත්‍යතාව මෙනෙහි කිරීමට රූපකලාප සොයන්නට පටන් ගත්හ. අනිත්‍යතාව නොදැක නිවන් දැකිය නොහැකි බැවිනි. මෙයින් සිදුවූයේ එදිනෙදා හමුවන රූපාකාර ගැන අනිත්‍යසංඥාව විස්වාසනීය ලෙස ගොඩනැංවීම මගහැරීමයි. ක්ලේෂය ඇතිවනුයේ අනෙක් රූපයකය අනිත්‍ය ලෙස දකිනුයේ වෙනත් රූපකලාපයකය.

වාහනයක් හො මේසයක් ගැන කථා කොට එය කොටස් වලට බෙදා දක්වා සබෑවට ඒවා නැති බව පසුකාලීන අභිධර්මය ඉගෙනගත් සමහරෙක් පවසති. වාහනයක කොටස් එකට සම්බන්ධව එක් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වීම එහි කොටස් වෙන් වෙන්ව තිබීම හා කිසිසේත් සම කළ නොහැක. එක් පද්ධතියක් ලෙස ක්‍රියත්මකවීම රූපයේ විශේෂිත ආකාරයකි. එය සිතෙහි පරිකල්පනයක් නම් නොවේ. එක්ව සම්බන්ධව ඇතිවිට රෝදවලට බර වැටී අනෙකුත් අංගෝපාංග තදවී ඇදී පවති. කොටස් හෝ අංශූ වසයෙන් සැළකීමේදි එම ධාතු විවිධත්වය මගහැරී යයි. පද්ධතිය ගැන ඇතිවන විඤ්ඤාන සංඥා ආදි මානසික ධර්මද මග හැරීයයි.

මේසයක් යනු ලී කුඩු සමූහයක් යැයි ගත්විට කුඩු අතර තිබුනාවූ බන්ධනය හෙවත් ආපෝ ධාතුව මගහැරී යයි. වැලි කඩදාසියකින් ලීයක් ලී කුඩු බවට පත්කරනුයේ බන්ධනය බිඳීමෙනි. මේසයක් මිලදී ගැනීමට යන ඔබට සත්‍ය වසයෙන් ඇත්තේ ලීකුඩු යැයි පවසා ලීකුඩු දුන්නොත් පිළිගන්නේද? දර්ශනය සැබෑ නම් පුද්ගලික කාරණාවලදීද භාවිතා විය යුතුය.

යාන, වාහන, ගෙවල්, දොරවල් ආදිය පඤ්ඤත්තියක් යැයි කියවුනද මිනිස් සිරුර පඤ්ඤත්තියක් හෙවත් සැබෑවට නැති දෙයක් යැයි කියවීමක් පසුකාලීන ග්‍රන්ථවල හමු නොවිණි. නොයෙක් අවස්ථාවල මිනිස් සිරුරේ අනිත්‍යතාව ගැන බුදුහිමියන් දේශනාකර ඇති බැවින් සූත්‍රයට සෘජුවම විරෝධවන බියෙන් එසේ නොකීවා විය හැක. නිවනට ඒකායන මාර්ගය සතිපට්ඨානයයි. එහි කායානුපස්සනාවේ සළකා බැලෙන රූපාකාර පිරික්සීමෙන් බුදුහිමියන් රූප ලෙස අදහස් කළේ කුමක්දැයි සරළව සිතාගත හැක. සියුම් රූපකළාප දැකගෙන විදර්ශනා කළයුතු නම් මහා කාරුණික බුදුරජාණන් වහන්සේ අසූහතර දහසක් ධර්මස්කන්ධය තුළ එය නොකියන්නට කාරණයක් නම් නැත.

පරමාර්ථ සම්මුති කථාව අසන පාඨකයන්ට පරමාර්ථය දැකිය යුතු බවත් සම්මුතිය ප්‍රහානය කළයුත්තක් යැයි ද අදහසක් පහළවේ. යමක් සැබෑවට නැත්නම් ඒය ඇති සේ දැකීම වරදකි. මේ නිසා පරිසරයේ නොයෙකුත් වස්තු හඳුනාගැනීම වරදක් හෝ සියුම් මුලාවක් යැයි සමහරුන් කල්පනා කරති. ප්‍රහානය කළයුතු විපල්ලාස කිහිපයක් බුදහමේ දැක්වේ. විපල්ලාස යනු විපරීත දැකීම්ය. ඒවා සියුම් ලෙස සංඥා මට්ටමිනුත් ඝනබහල වූ විට දෘෂ්ටි ලෙසින්ද මනසෙහි ක්‍රියාත්මක වේ.

## අඞ්ගුත්තරනිකාය-චතුක්කනිපාත- විපල්ලාසසුත්තං

''චත්තාරෝමේ, භික්ඛවේ, සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා. කතමේ චත්තාරෝ? අනිච්චේ, භික්ඛවේ, නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ; දුක්ඛේ, භික්ඛවේ, සුඛන්ති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ; අනත්තනි, භික්ඛවේ, අත්තාති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ; අසුභේ, භික්ඛවේ, සුභන්ති සඤ්ඤාවිපල්ලාසෝ චිත්තවිපල්ලාසෝ දිට්ඨිවිපල්ලාසෝ. ඉමේ ඛෝ, භික්ඛවේ, චත්තාරෝ සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා."

(මහණෙනි සඤ්ඤා චිත්ත දිට්ඨි ලෙස විපල්ලාස(විපරීත දැකීම්) සතරකි. කුමක්ද එම සතර යත්? මහණෙනි අනිත්‍ය වූ දෙයෙහි නිත්‍ය යැයි සඤ්ඤාවිපල්ලාසයකි චිත්තවිපල්ලාසයකි දිට්ඨිවිපල්ලාසයකි. මහණෙනි දුක්වූ දෙයෙහි සැප යැයි සඤ්ඤාවිපල්ලාසයකි චිත්තවිපල්ලාසයකි දිට්ඨිවිපල්ලාසයකි. මහණෙනි අනාත්ම දෙයෙහි ආත්ම යැයි සඤ්ඤාවිපල්ලාසයකි චිත්තවිපල්ලාසයකි දිට්ඨිවිපල්ලාසයකි. මහණෙනි අසුභවූ දෙයෙහි සුභ යැයි සඤ්ඤාවිපල්ලාසයකි චිත්තවිපල්ලාසයකි දිට්ඨිවිපල්ලාසයකි.)

රූප වේදනා ආදිය නිත්‍ය, සැප, ආත්ම, සුබ ලෙස දැකීම හැඳිනීම විපල්ලාසයයි. රූපාකාර හැඳිනීම විපල්ලාසයක් නොවේ. රහතන් වහන්සේලා රූප හඳුනාගන්නා නමුත් විපල්ලාසයෙන් තොරය. මේ දෙක අතර ඇත්තේ සියුම් වෙනසකි. මූලපරියාය සූත්‍රය ඊට සාධකයි. නමුත් පරමාර්ථ සම්මුති කථාවෙන් සිදුවූයේ ප්‍රහානය නොකළ යුත්තක් ප්‍රහානය කළයුතු සේ හැඟී යාමයි. ප්‍රහානය කළයුත්තේ අකුසල්ය. ලෝබ, ද්වේෂ, මෝහ යනාදියයි. ඉහත විපල්ලාසද ප්‍රහානය කළයුතුය. මෙම අකුසල්ද සැබෑවටම හටගන්නා විද්‍යමාන ධර්මයෝය. එනම් පරමාර්ථයේම කොටසක් බවයි. කුසලය අකුසලය අබ්‍යාකතය ලෙස පරමාර්ථය කොටස් තුනකට බෙදිය හැක. මෙලෙස පරමාර්ථය තුළම අකුසලය හා විපල්ලාස කියවෙන බැවින්ද පරමාර්ථ සම්මුති කථාවක් අවශ්‍ය නොවේ.

## සද්ධර්ම ප්‍රතිරූපක අන්තදෙක - විඤ්ඤානවාදය හා පරමාණුවාදය.

### පරමාණුවාදය

පරමාර්ථ ලෙස ගැනෙන චිත්ත, චෛතසික, රූපාදිය අති සූක්ෂම බවත් සාමන්‍යය මනසට අරමුණු නොවන බවටත් පසුකාලීන මතයක් බිහිවී තිබේන බව සඳහන් කරන ලදී. පරමාර්ථ

අරමුණු වනුයේ විශිෂ්ට ඤාණයකට හෝ ගැඹුරු සමාධියකට යැයි සමහරු සිතති. මේ නිසා අභිධර්මය හැදෑරීම ඉලක්කයක් නැති හුදු දැනුම ගොඩගහන්නක් පමණක් වී තිබේ. එදිනෙදා ජීවිතයට සම්බන්ධයක් නැති ප්‍රායෝගික බවින් තොර දෙයක් වී තිබේ. පරමාර්ථ අමුතුවෙන් දැකිය යුතුයැයි කීමද සාවද්‍යය. උත්සාහ නොකළත් දැනෙන බැවිනි.

චක්ඛුවිඤ්ඤාණ, සෝතවිඤ්ඤාණ ආදි ඤාණසම්ප්‍රයුක්ත නොවන විපාක සිත්ද වර්ණරූප සද්ද ආදි සැබෑ ධර්ම ඔස්සේ හටගනිති. එවැනි සිත් පවතින විට සිතේ සමාධිමය ගුණය දුර්වලය. මේනිසා පරමාර්ථ අරමුණු වනුයේ විශිෂ්ට ඤාණයකට හෝ ගැඹුරු සමාධියකට යයි සිතාගැනීම මඟවරදවන බව වටහා ගතයුතුය. මෙම පටලැවිල්ල පට්ඨානයේ පහත උධෘතයෙන් තවදුරටත් වැටහෙනු ඇත.

## පට්ඨානපාළි

**''අනියතො ධම්මො නියතස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො; රූපජීවිතින්ද්‍රියං මාතුඝාතිකම්මස්ස.. පිතුඝාතිකම්මස්ස.. ආරම්මණපච්චයෙන පච්චයො''**

**(අනියත ධර්මයක් නියත ධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්:- රූපජීවිතින්ද්‍රිය මව මැරීමේකර්මයට...පියා මැරීමේකර්මයට.... ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්)**

අපායට හෝ නිවනට ඒකාන්තයෙන්ම පමුණුවන ධර්ම නියත ධර්මයි. එසේ නොපමුණුවන දෑ අනියතයි. අභිධර්මය තරමක් දුරට හදාරා ඇත්නම් රූපජීවිතින්ද්‍රිය නැමැති රූපයක් ගැන සමහරවිට ඔබ අසා ඇතුවා විය හැක. මෙය කර්මජ රූපයන් සමග එක්ව පවත්නා රූපාකාරයකි. රූපජීවිතින්ද්‍රිය යන වචනය ඇසෙන විටම තරමක දූරස්ථ බාවයක් හැඟෙනු ඇත. සාමාන්‍යයෙන් අරමුණු නොවන දෙයක් මෙන් වැටහෙනු ඇත. නමුත් ඉහත පාඨයට අනූව

මව් මැරීමේදී හෝ පියා මැරීමේදී හෝ අරමුණු වන්නේ එයයි.

විද්‍යාත්මක උපකරණ තුළින් හෝ ගැඹුරු සමාධියකින් සමහර සියුම් රූපාකාර දැකිය හැකි බව සත්‍යයකි. රෝගාබාධ සුවපත් කරගැනීමට විනා විශේෂ විදර්ශනා අර්ථයක් එහි නැත. නාම රූප අතර සහසම්බන්ධය වටහාගැනීම වඩා වැදගත් වේ. පරමාර්ථ සාමන්‍යය මනසට අරමුණු වන්නේද නැත්ද යන සැකය තවදුරටත් දුරුකරගතයුතුව ඇත.

මේ සඳහා අභිධර්මපිටකයේ අවසාන කොටසේ එනම් පට්ඨානයේ ආරම්මණ ප්‍රත්‍යය සමබන්ධයෙන් වන විස්තර ඉතා වැදගත්වේ. කුසලත්‍රිකය අදාළව ආරම්මණ ප්‍රත්‍යය විභාග යේ කොටසක් පහත දක්වා ඇත. ඡේද අංක ඡට්ඨසංගායනා සංස්කරණයේ ඇති පරිදිය. ග්‍රන්ථය දිගුවන බැවිනුත් සමහර කාරණා තේරුම් ගැනීමට පූර්ව දැනුමක් පාඨකයාට අවශ්‍ය බැවිනුත් ඒ ඒ ඡේදවල සමහර කොටස් ඉවත් කිරීමට සිදුවිය.

## <u>ආරම්මණප්‍රත්‍යය</u>

**404. කුසලෝ ධම්මෝ කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයො - දානං දත්වා සීලං සමාදියිත්වා උපෝසථකම්මං කත්වා තං පච්චවෙක්ඛති, පුබ්බේ සුචිණ්ණානි පච්චවෙක්ඛති, ඣානා වුට්ඨහිත්වා ඣානං පච්චවෙක්ඛති.............. සෙක්ඛා වා පුථුජ්ජනා වා කුසලං අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විපස්සන්ති, චේතෝපරියඤාණේන කුසලචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානන්ති. ......**

(කුසලධර්මයක් කුසලධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- දානයක් දී සීලයක් සමාදන් වී උපෝසථ කර්මයක් කොට එය නුවණින් සළකා බලයි. පෙර මනාව හුරු කළදෑ ප්‍රත්‍යාවේක්ෂා කරයි. ධ්‍යානයෙන් නැගීසිට ධ්‍යානය ගැන නුවණින් සළකා බලයි......සේඛ පුද්ගලයෙක් හෝ සාමාන්‍ය මනුෂ්‍යයෙක් හෝ

කුසලය අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරයි. චේතෝපරියඤාණයෙන් කුසලසිතක් ඇතියෙකුගේ සිත දැනග නිත්........)

**405. කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ - දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා තං අස්සාදේති අභිනන්දති; තං ආරබ්භ රාගෝ උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දෝමනස්සං උප්පජ්ජති. පුබ්බේ සුචිණ්ණානි අස්සාදේති අභිනන්දති; තං ආරබ්භ රාගෝ උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දෝමනස්සං උප්පජ්ජති. ඣානා වුට්ඨහිත්වා ඣානං අස්සාදේති අභිනන්දති; තං ආරබ්භ රාගෝ උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති. ඣානේ පරිහීනේ විප්පටිසාරිස්ස දෝමනස්සං උප්පජ්ජති.**

(කුසලධර්මයක් අකුසලධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- දානයක් දී සීලයක් සමාදන් වී උපෝසථ කර්මයක් කොට එය ආස්වාදය කරයි අභිනන්දනය කරයි; එය අරඹයා රාගය උපදී, දෘෂ්ටියක් හටගනී, සැකය හටගනී, උද්ධච්චය හටගනී, දොම්නසක් හටගනී. ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය ආස්වාදය කරයි අභිනන්දනය කරයි; එය අරඹයා රාගය උපදී, දෘෂ්ටියක් හටගනී, සැකය හටගනී, උද්ධච්චය හටගනී. ධ්‍යානයෙන් පිරිහුණු විට විපිළිසර වූවාහුට දොම්නසක් උපදී.)

**406. කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ - අරහා මග්ගා වුට්ඨහිත්වා මග්ගං පච්චවෙක්ඛති; පුබ්බේ සුචිණ්ණානි පච්චවෙක්ඛති; කුසලං අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විප්පස්සති; චේතෝපරියඤාණේන කුසලචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානාති.....**

(කුසලධර්මයක් අබ්‍යාකතධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- රහත්නමක් අරහත් මාර්ගයෙන් නැගිට මාර්ගය නුවණින්

සළකා බලයි. පෙර මනාව හුරු කළදෑ ප්‍රත්‍යාවේක්ෂා කරයි. රහතන් වහන්සේ කුසලය අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරයි. චේතෝපරියඥාණයෙන් කුසලසිතක් ඇතියෙකුගේ සිත දැනගනිත්.........

**407. අකුසලෝ ධම්මෝ අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ - රාගං අස්සාදේති අභිනන්දති; තං ආරබ්භ රාගෙ ා් උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දෝමනස්සං උප්පජ්ජති. දිට්ඨිං අස්සාදේති අභිනන්දති; තං ආරබ්භ රාගෝ උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දෝමනස්සං උප්පජ්ජති. විචිකිච්ඡං ආරබ්භ ..........**

(අකුසලධර්මයක් අකුසලධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- රාගය ආස්වාදය කරයි අභිනන්දනය කරයි; එය අරඹයා රාගය උපදී, දෘෂ්ටියක් හටගනී, සැකය හටගනී, උද්ධච්චය හටගනී, දොම්නසක් හටගනී. දෘෂ්ටිය ආස්වාදය කරයි අභිනන්දනය කරයි; එය අරඹයා රාගය උපදී, දෘෂ්ටියක් හටගනී, සැකය හටගනී, උද්ධච්චය හටගනී, දොම්නසක් හටගනී.........)

**408. අකුසලෝ ධම්මෝ කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ - සෙක්ඛා පහීනේ කිලෙසේ පච්චවෙක්ඛන්ති, වික්ඛම්භිතේ කිලෙසේ පච්චවෙක්ඛන්ති, පුබ්බේ සමුදාචිණ්ණේ කිලෙසේ ජානන්ති, සෙක්ඛා වා පුථුජ්ජනා වා අකුසලං අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විපස්සන්ති, චේතෝපරියඤාණේන අකුසලචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානන්ති. අකුසලා ඛන්ධා චේතෝපරියඤාණස්ස, පුබ්බේනිවාසානුස්සතිඤාණස්ස, යථාකම්මූපගඤාණස්ස අනාගතංසඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයෝ.**

(අකුසලධර්මයක් කුසලධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- සේක්ෂයො ප්‍රහීන කෙළෙස් ප්‍රත්‍යවෙක්ෂා කරති, විශ්කම්භනය වූ

කෙළෙස් ප්‍රත්‍යවෙක්ෂා කරති, පෙර නිතර හටගත් කෙළෙස් දැනගනිත්, සේකයා හෝ පෘථජ්ජනයා හෝ අකුසලය අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරත්. චෙතෝපරියඥාණයෙන් අකුසලසිතක් ඇතියෙකුගේ සිත දැනගනිත්. අකුසල ස්කන්ධයෝ චේතෝපරියඥාණයට පුබ්බේනිවාසානුස්සතිඥාණයට, යථාකම්මූපගඥාණයට, අනාගතංසඥාණයට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.)

**409. අකුසලෝ ධම්මෝ අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ - අරහා පහීනේ කිලෙසේ පච්චවෙක්ඛති, පුබ්බේ සමුදාචිණ්ණේ කිලෙසේ ජානාති, අකුසලං අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විපස්සති, චේතෝපරියඥාණේන අකුසලචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානාති...........**

(අකුසලධර්මයක් අබ්‍යාකතධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- රහත්නමක් ප්‍රහීන කෙළෙස් ප්‍රත්‍යාවේක්ෂා කරයි. පෙර නිතර හටගත් කෙළෙස් දනී. අකුසලය අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරත්. චෙතෝපරියඥාණයෙන් අකුසලසිතක් ඇතියෙකුගේ සිත දැනගනිත්........)

**410. අබ්‍යාකතෝ ධම්මෝ අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ -..... අරහා චක්ඛුං අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විපස්සති. සෝතං.... ඝානං.... ජිව්හං... කායං.... රූපේ.. සද්දේ .. ගන්ධේ.... රසේ.... ඵොට්ඨබ්බේ... වත්ථුං... විපාකාබ්‍යාකතේ කිරියාබ්‍යාකතේ ඛන්ධේ අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විපස්සති, දිබ්බේන චක්ඛුනා රූපං පස්සති, දිබ්බාය සෝතධාතුයා සද්දං සුණාති, චේතෝපරියඥාණේන විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකතචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානාති ..... රූපායතනං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ. සද්දායතනං සෝතවිඤ්ඤාණස්ස ... ගන්ධායතනං ඝානවිඤ්ඤාණස්ස.... රසායතනං ජිව්හාවිඤ්ඤාණස්ස .....**

**ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණස්ස ආරම්මණපච්චයේන පච්චයො ..**

(අබ්‍යාකතධර්මයක් අබ්‍යාකතධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- රහතන් වහන්සේ ඇස අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරත්. කණ .. නාසය ... දිව ... කය ... රූපය ... ශබ්ද .. ගන්ධ .. රස .. පහස ... වස්තුව .. විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකත ස්කන්ධයන් අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරත්. දිවැසින් රූප දකිත්. දිවකණින් ශබ්ද අසත්. චේතොපරියඤාණයෙන් විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකතසිතක් ඇතියෙකුගේ සිත දැනගනිත්........ රූපායතනය චක්ඛුවිඤ්ඤාණයට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්. සද්දායතනය සෝතවිඤ්ඤාණයටත්‍ව ගන්ධායතනය ඝානවිඤ්ඤාණයට ... රසායතනය ජිව්හාවිඤ්ඤාණයට ... ඵොට්ඨබ්බායතනය කායවිඤ්ඤාණයට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත්.........)

**411. අබ්යාකතෝ ධම්මෝ කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ -....... සෙක්ඛා වා පුථුජ්ජනා වා චක්ඛුං අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විප්පස්සන්ති. සෝතං .. ඝානං ... ජිව්හං .. කායං .. රූපේ .. සද්දේ .. ගන්ධේ .. රසේ .. ඵොට්ඨබ්බේ .. වත්ථුං .. විපාකාබ්යාකතේ කිරියාබ්යාකතේ ඛන්ධේ අනිච්චතෝ දුක්ඛතෝ අනත්තතෝ විපස්සන්ති, දිබ්බේන චක්ඛුනා රූපං පස්සන්ති, දිබ්බාය සෝතධාතුයා සද්දං සුණන්ති, චේතොපරියඤාණේන විපාකාබ්යාකතකිරියාබ්යාකතචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානන්ති. ...**

(අබ්‍යාකතධර්මයක් කුසලධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- ....... සේකයා හෝ පෘථජ්ජනයා හෝ ඇස අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරත්. කණ .. නාසය .. දිව .. කය .. රූපය .. ශබ්ද .. ගන්ධ .. රස .. පහස .. වස්ථුව .. විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකත ස්කන්ධයන් අනිත්‍ය ලෙස දුක් ලෙස අනාත්ම ලෙස විපස්සනා කරත්. දිවැසින් රූප දකිත්. දිවකණින් ශබ්ද අසත්.

චේතොපරියඤාණයෙන් විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකත සිතක් ඇතියෙකුගේ සිත දැනගනිත්........)

**412. අබ්යාකතෝ ධම්මෝ අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයේන පච්චයෝ - චක්ඛුං අස්සාදේති අභිනන්දති; තං ආරබ්භ රාගෝ උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දෝමනස්සං උප්පජ්ජති. සෝතං .. ඝානං .. ජිව්හං .. කායං .. රූපේ .. සද්දේ .. ගන්ධේ .. රසේ .. ඵොට්ඨබ්බේ .. වත්ථුං .. විපාකාබ්යාකතේ කිරියාබ්යාකතේ ඛන්ධේ අස්සාදෙති අභිනන්දති; තං ආරබ්භ රාගෝ උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දෝමනස්සං උප්පජ්ජති.**

(අබ්‍යාකතධර්මයක් අකුසලධර්මයකට ආරම්මණප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් :- ඇස ආස්වාදය කරයි අභිනන්දනය කරයි; එය අරඹයා රාගය උපදී, දෘෂ්ටියක් හටගනී, සැකය හටගනී, උද්ධච්චය හටගනී, දොම්නසක් හටගනී. කණ .. නාසය .. දිව .. කය .. රූපය .. ශබ්ද .. ගන්ධ .. රස .. පහස .. වස්තුව .. විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකත ස්කන්ධයන් ආස්වාදය කරයි අභිනන්දනය කරයි; එය අරඹයා රාගය උපදී, දෘෂ්ටියක් හටගනී, සැකය හටගනී, උද්ධච්චය හටගනී, දොම්නසක් හටගනී.)

කුසල අකුසල අබ්‍යාකත ලෙස සියලු නාම-රූප ධර්ම බෙදිය හැක. සියලු රූපාකාරත් කුසල හෝ අකුසල නොවන අනෙකුත් සියලු මානසික ධර්මත් නිවනත් අබ්‍යාකතය ලෙස සංග්‍රහවේ. කුසල අකුසල නොවන අනෙකුත් මානසික ධර්ම ලෙස විපාක සිතිවිලිත් ක්‍රියා සිතිවිලිත් දැක්විය හැක. කුසල යනු දක්ස බාවයයි. අනාගතයේ ඉෂ්ට විපාක ගෙනදෙනුයේ කුසලයයි. අනිෂ්ට විපාක ගෙනදෙනුයේ අකුසලයයි.

රහතන් වහන්සේ කෙරෙහිත්, සංස්කාරයන් අනිත්‍යාදි ලෙස මැනවින් දක්නා කුසල ප්‍රතිරූපක සිතිවිලි ඇතිවුවද අනාගතයේ ඉෂ්ට විපාක ගෙනදීමේ ශක්තියක් ඒවාට නැති බැවින්, එම

සිතිවිලි අබ්‍යාකත ගණයට ඇතුළත්ව ක්‍රියාසිත් ලෙස හැඳින්වේ. කුසල අකුසල අබ්‍යාකත ධර්මයන් ගැන පුළුල් විස්තරයක් කිරීම මෙම කෘතියේ අරමුණ නොවේ. එනමුත් ඉහත පෙළ පුළුල් ලෙස අධ්‍යනය බොහෝ මිථ්‍යා මතවාදයන්ගෙන් මිදීමට ඔබට උපකාරී වනු ඇත.

මට යමක් දැනෙනවා, මම යමක් දැනගන්නවා ආකාරයේ මමත්වය මූලික දැක්මක් වෙනුවට ඒ ඒ හේතූන් නිසා ඵල හටගන්නා බව බුදුදහමයි. එම දර්ශනයට අනුයාත වෙමින් කුසල අකුසල අබ්‍යාකත ධර්මයන් විවිධ අරමුණු ඔස්සේ හටගන්නා ආකාරය ඉහත පට්ඨාන පාලියෙන් දැක්වේ.

කුසලධර්මයක් කුසල අකුසල අබ්‍යාකතකට අරමුණු වන අවස්ථා කිහිපයකට උදාහරණ පළමු කොටස් තුනෙන් විග්‍රහවේ(404-405-406). අකුසල ධර්මයක් කුසලාකුසලඅබ්‍යාකතකට (407-408-409) අරමුණු වන අවස්ථා දෙවන කොටස් තුනෙන්ද, අවසාන කොටස් තුනෙන් (410-411-412) අබ්‍යාකතධර්මයක් කුසලාකුසලඅබ්‍යාකතකට අරමුණු වීම දැක්වේ. අරමුණු වීම යනු යමක් ගැන දැනුවත් වීමය ඉලක්ක වීමය. එක් සන්තානයක කුසලය ඇතිවිට අකුසලය නැත. අකුසලය හටගෙන ඇතිවිට කුසලය නැත. අතීත අනාගත වසයෙන් අරමුණු වීම සිදුවේ. කුසලයක් අරමුණු වීම යනු කුසල සිතක් හටගැනීමම නොවේ. එලෙසම අකුසලයක් අරමුණු වීම යනු අකුසල සිතක් හටගැනීමම නොවේ. අරමුණු දෙස බලන ආකාරය අනුව කුසලාකුසල බව තීරණය වේ.

එදිනෙදා ජීවිතයේ අත්දකින රූපාකාර, ඇතිවන සිතුවිලි ඉලක්ක කොට අරමුණු කොට කුසලාකුසලඅබ්‍යාකතක හැඟීම් හටගන්නා ආකාරය සමහර උදාහරන තුලින් පෙනීයයි. රහතන්වහන්සේද සේඛ උතුමන් ද සාමාන්‍ය මිනිසුන්ද ඇස, කණ ආදි රූප අනිත්‍යාදි ලෙසින් විපස්සනා කරන අතර එම ඇස, කණ ආදි රූපම අරඹයා කෙළෙස් ඇතිවන ආකාරය අවසාන ජේදයෙන් දැක්වේ.

කෙළෙස් ඇතිවීමට නම් ඒම රූපාකාර දැන හඳුනා ගත යතුය. කෙළෙස් ඇතිවන්නාවූත් අනිත්‍ය ලෙස මෙනෙහි කරන්නාවූත් රූපාකාර (චක්ඛු සෝත...ලෙස) හඳුන්වාදී ඇත්තේ එකම නම් වලිනි (410-411-412). රූපාකාර පමණක් නොව මානසික ධර්මද කෙරෙහිද මෙලෙසමය. විපස්සනා කරනවා කියා සියුම් රූපකළාප සම්මර්ෂනයක් එම ඡේදවල දක්වා නැත.

මෙම ඡේද කිහිපය හැදෑරීමෙන් පරමාණු වාදයෙන් පමණක් නොව විඤ්ඤාණවාදයෙන්ද මිදිය හැක. විඤ්ඤාණවාදයට අනුව රූප සැබෑවට නැත සිතේ මැවීමක් පමණය. එයට අනුව ඤාණදර්ශනය පහළ වූවිට ලේ මස් ඇස කන ආදි රූපාකාර අහෝසි වීයයි. නමුත් රහතන් වහන්සේද ඇස කණ නාස දිව කය ආදි රූපාකාර අනිත්‍යාදි ලෙසින් විපස්සනා කරන බව ඉහත දක්වා ඇත. පූර්ණ අවබෝධයත් සමගම රූප අහෝසී වී නම් අනිත්‍යාදි ලෙසින් විපස්සනා කරනවායැයි කීම තේරුමක් නැත.

## විදර්ශනාවට බලපාන පසුකාලීන වෙනස්කම් තවදුරටත්

- රූපවල ආයුකාලයන් සමලෙස දැක්වීම

නිවන් දැකීමට අනිත්‍යතාවය දැකිය යුතුමය. නාම ධර්මයන්ගේ කෙසේ වෙතත් රූප ධර්මයන්ගේ අනිත්‍ය දැකීම අද ප්‍රහෙලිකාවකි. ඉතා කුඩා රූපයන් සමාන ආයු කාලයන් පැවත ක්ෂණයක් පාසා බිඳී යන බව සමහරුන් සිතති. එය භංගානුපස්සනාව යැයිද සිතති. හේතුන් ගෙන් හටගන්නා දේ හේතු නැති වී යාමෙන් බිඳී යන බව බුද්ධ දේශනාවයි. සෑම රූපයකම ආයුකාලය සම ලෙස ගත්විට රූප බිඳී යනුයේ කාලය ගතවීමෙන් මිස හේතු නැතිවීමෙන් නොවේ. භංගානුපස්සනාඤානය ගැන පැහැදිලි විස්තරයක් ඇත්තේ පටිසම්භිදාමග්ගයේය. එහි සඳහන් වන්නේ චිත්ත චෛතසිකවල භංගය ගැන මිස රූපවල නොවේ.

රූපයක ආයුකාලය චිත්තක්ෂණ 17 බවත් සිතක ආයුකාලය සිතා ගත නොහැකි තරම් කුඩා කාලයක් බවත් පසුකාලීන අභිධර්ම ග්‍රන්ථවල දක්නට ඇත. ශරීරයේත් ඉන් පිටත බාහිර වස්තු තුළත් ඇති රූප මෙලෙස චිත්තක්ෂණ 17කින් බිඳීයන්නේ නම් එය විශ්වීය ධර්මතාවයකි. මෙවන් විශ්වීය ධර්මතාවයක් ත්‍රිපිටකගත අභිධර්මය වන සප්තප්‍රකරණය තුළ සඳහන් නොවීම අතිශයින් පුදුම සහගතය.

ඇත්තෙන්ම අටුවාවට පාදක වූ මහා අට්ඨකථාවේ සඳහන්ව ඇත්තේ චිත්තක්ෂණ 16 ලෙසය. විභංගට්ඨකථාවේ ස්කන්ධ විභංග යට අදාළ ප්‍රකීර්ණක කාණ්ඩයට අදාළ විස්තරයකදී අටුවාචාරීන් වහන්සේ යමකප්‍රකරණයේ සඳහන් කාරණයක් දක්වා එය 17 විය යුතු බවට තර්කයක් ගෙනාවේය. එයින් පසු එය 17 විය. ඇත්තෙන්ම 17 ද16ද යන්න විදර්ශනාවට අදාළත්වයක් නැති බව වැටහුනා නම් එයම ප්‍රමාණවත්ය.

අනෙකුත් රූප කෙසේ වෙතත් කර්මජ රූපවල ආයුකාලයන් සමවිය නොහැකි බව ධම්මසඞ්ගණීපාළියේ රූපක්ඛණ්ඩයේ රූපජීවිතින්ද්‍රිය අර්ථ දැක්වීම අධ්‍යයනයෙන් පැහැදිලිවේ. ඇස කන දිව වැනි රූපාකාර සමහරක් කර්මජ රූප ලෙස දක්වා ඇත. සතර මහාභූතයන්ගේ උපාදාය රූපාකාර වන්නා සේම ඒවා කර්මජ රූප ලෙසද හඳුන්වනු ලැබේ.

''කතමං තං රූපං ජීවිතින්ද්‍රියං? යො තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං ..''

ඉහත අදහස, කර්මජ රූපයන්ගේ ආයුසයක් පැවැත්මක් යැපීමක් පාලනයක් ජීවිතයක් වේද එය රූපජීවිතින්ද්‍රිය නැමති වේයනුයි. කර්මජ රූපයන්ගේ පවත්නා කාලයන්හි වෙනස්කම් නැත්නම් බුදුහිමියන් විසින් මෙවන් අර්ථදැක්වීමක් කිරීම නිරර්ථකය. සෑම කර්මජරූපයකම ආයුකාලය සමනම් රූපජීවිතින්ද්‍රියෙන් කුමක් පාලනය කරන්නේදැයි ගැටළුවක් පැනනඟී.

## අනිත්‍ය සංඥාව යනු කුමක්ද

උපාදානයට ලක්විය හැකි රූප වේදනා ආදි පංචස්කන්ධ ධර්මයන්ගේ අනිත්‍යතාව දැකීම යනු කුමක්දැයි විමසිය යුතු කාරණවකි. රූපයේ අනිත්‍යතාව දැකීම යනු තමන් ඉදිරියේ වළඳක් බිඳී යනවා මෙන් ශරීරයේ සියුම් රූපකළාප බිඳී යනබව වැටහීමද? එවිට අතීත හා අනාගත රූප ගැන කෙසේද? අතීත රූප දැන් නැත. අනාගත රූපද මේ මොහොතේ නැත. දැන් නැති දෙයක් බලා සිටිද්දී බිඳී යනවා දකින්නේ කෙසේද?.

මළ සිරුරකට අත්වන ඉරණම නවසීවථික භාවනාවේ දක්වා ඇත. ඉදිමුණු නිල්වුනු මස්නැති අවසානයේ ඇටකටුත් ක්ෂය වී ගිය අවස්ථා බහුල වසයෙන් සිහි කරන යෝගාවචරයාට ඒ ඒ අවස්ථාවල අනිත්‍යතාව ප්‍රකට වේ. යම් රූපාකාරයක් අරමුණු වූවිට එය ස්ථිරව නොපවතින අවස්ථාවක් ලෙස හැඟී යයි නම් එය අනිත්‍ය සංඥාවයි. තවදුරටත් එම අවස්ථාව හේතූන්ගෙන් හටගත් ලෙස වැටහේ නම් හේතූන් නැතිවීමෙන් නැතිවන බවත් වැටහේ නම් එය ඥාණය විසඳ වූ මුහුකුරා ගිය අවස්ථාවය.

මිනිස් සිරුරේ විවිධ අවස්ථා සිහිකරනුයේ පිළිකුල් සංඥාව වඩා ගැනීමටත් ඒ ඒ අවස්ථාවල අනිත්‍යතාව ප්‍රකට කරගැනීමටත්ය. මෙය කාලයක් පුරා දිවයන අනිත්‍යතාවක් හෝ යමක් කාලයක් පැවත නැතිවීයාමක් ලෙස සිතීමක් නොවේ. සමහරුන් එසේ සිතූ නිසාදෝ එය ඕලාරික අනිත්‍යතාවයක් යැයි සළකා රූපකළාපවල ක්ෂණ භංග සෙවීමට පෙළඹුනහ. මෙවිට මඟහැරුනේ නිවනට ඒකාන්ත මාර්ගය යැයි සර්වඥතාඥාණයෙන් දේසනාවූ සතිපට්ඨානයයි. මේ නිසා මරණානුස්සති වැනි භාවනා සුළු කොට තැකිය නොහැක. එක් ධර්මයක් වැඩුව හොත් ඒකාන්තයෙන්ම නිවන් පිණිස පවතී යැයි මරණානුස්සතිය සඳහාත් දේසනාවූ බව සිහි කරගැනීමද වටී.

ජලය අයිස් බවටද පත්විය හැක. වාෂ්ප බවටද පත්විය හැක. නමුත් ජලය අයිස් වනවා යැයි කීමට පාදක වන හැඟීමේ ඒක්තරා දෝෂයක් ඇත. ජලය යන අවස්ථාව තරමක් ග්‍රහණය කොටය එසේ කියනුයේ. අනිත්‍ය සංඥාව වැඩීමේදි වැදගත් වනුයේ ජලය කුමක් බවට පරිවර්තනය වන්නේද නොව ජලය යන අවස්ථාව නැතිව යන බවයි. ඇත්තෙන්ම ඥාණය යනු ඍජුව නොපෙනන අනිත්‍ය ස්වභාවය අරමුණ විනිවිද ගොස් මතුකරගැනීමයි. වළන් බිඳෙන්නාක්මෙන් ඉදිරියේ රූපකළාප බිඳීයන අයුරු දකින ඕලාරික දැක්මක් නොවේ.


## අවසාන වශයෙන්

මෙලෙසින් බොහෝ කරුණු දැක්වූයේ අටුවා ටීකා සහ මෑතකාලීන සංග්‍රහ ග්‍රන්ථ ප්‍රතික්ෂේප කරවීමට නම් නොවේ. විශේෂයෙන්ම නිර්මල විපස්සනා මාර්ගය මතුකරදීමටය. නුවණ ඇතිඅයට දුර්වලතා ගැන සැළකිලිමත් වෙමින් ඒවා හැදෑරීමද කළහැක. බොහෝ භාවනායෝගී ස්වාමීන් වහන්සේලා මෙවැනි දුර්වලතා ගැන දැනුවත්ය. ඔවුන් අතර මෙය ප්‍රසිද්ධ රහසකි. නමුත් සම්ප්‍රදායට, ආචාර්යවරුන්ට විරුද්ධවෙතැයි බියෙන් එළිපිට ප්‍රකාස නොකරති. භාවනාව ගැන උනන්දුවන ගිහි පින්වතුන් බොහෝ දෙනෙක් මෙකල දැකිය හැක. ඔවුනට මේ කෘතිය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැක.

කාළාම වැසියන්ට බුදුහිමියන් දුන් අවවාදයද සිහි කරගැනීම වටී. තම ආචර්ය පරම්පරාවෙන් ආනිසාම හෝ ගරු කටයුතු ආචර්ය මතයක් කියා හෝ එපමණකින්ම පිළිගතයුත්තේ නොවේ. එසේනම් කුමක් පිළිගතයුතු දැයි පාඨකයාට ගැටළුවක් වනුඇත. පිළිතුර සරලය. ත්‍රිපිටකයම මුල්කොට එයම ගරුකොට කරුණු විග්‍රහ කරගැනීමයි.

පසුකාලීන සම්ප්‍රදායට අනුව අභිධර්මය හැදෑරූ අයගෙන් මෙම කෘතියේ කරුණු සම්බන්ධයෙන් විමසීමෙන් පාඨකයන්ට

# ථේරවාද අභිධර්ම ඇදුනුව - පරමාර්ථය හා සම්මුතිය



පට්ඨානයේ ආරම්මණ විභාගය නොසළකා හැරීම

සාමාන්‍යයෙන් අරමුණු වන්නේ පඤ්ඤත්ති බවත්, එය ආරම්මණ ප්‍රබේද දැක්වීමේදී පඤ්ඤත්තාරම්මණ ලෙස ධම්මාරම්මණයේ ප්‍රබේදයක් ලෙසත් දැක්විනි.

රථය, මිනිස් සිරුර වැනි පඤ්ඤත්ති ලෙස සැළකූ දෑ, අවිද්‍යමාන හෙයින් අනිත්‍ය යැයි නොකිවයුතු බවටත්, පරමාර්ථ දැනට නොදැනෙන නිසා අනිත්‍ය ලෙස මෙනෙහි කරගත නොහැකි වීමත් සිදුවිය.

විද්‍යමානයට කළ නාමකරණය විද්‍යමානපැනවීම් හෙවත් විද්‍යමානපඤ්ඤත්ති. අවිද්‍යමානයට කළ නම්දීම අවිද්‍යමානපඤ්ඤත්ති.

පසුකාලීනව නාමකරණයෙට පමණක් නොව අවිද්‍යමානයටම අවිද්‍යමානපඤ්ඤත්ති. ලෙස හැඳින්වීම

අවිද්‍යමාන කොටස ලොප්වී පඤ්ඤත්ති යන්න, රථය, පුද්ගලයා ආදිය සඳහා යෙදීම

මෙසේ පරමාර්ථයට විරුද්ධාර්ථ පදයක් ලෙස පඤ්ඤත්ති භාවිතවීම

පඤ්ඤත්තියේ මුල් අදහස වූ නාමකරණය, ජනසමාජයේ සම්මතයක් බැවින් අවිද්‍යමානයට සම්මුති ලෙස ව්‍යවහාරවීම

අභිධර්මය හැදෑරීමට පරමාර්ථ සම්මුති කථාවක් අනවශ්‍ය බව වටහා ගතයුතු.

අභිධර්ම මූලටීකාචාර්ය මතය නොසළකා හැරීම

අවිද්‍යමානය, අවිද්‍යමානපඤ්ඤත්ති වචනය ඔස්සේ පඤ්ඤත්ති වෙත් නම්, පරමාර්ථයද විද්‍යමානපඤ්ඤත්ති වචනය ඔස්සේ පඤ්ඤත්තියක් වනබව නොතේරීම

නාමපඤ්ඤත්ති හා අර්ථපඤ්ඤත්ති ලෙස පඤ්ඤත්තියට අර්ථ දෙයාකාරයක් බිහිවීම

අද කාලයේ ථේරවාද අභිධර්ම ග්‍රන්ථවල එන

**පරමාර්ථ සම්මුති කථාව**

Valagamba.net

එතරම් ඵලක් නොවනු ඇත. මෙකල දක්නට ලැබෙන බොහෝ අභිධර්ම ගුරුවරු අභිධර්මපිටකය තරමක් දුරට හෝ පරිශීලනය කරඇත්දැයි සැක සහිතය. තවද බොහෝ පසුකාලීන පොත්වල සදොස් කරුණු ඒකම ආකාරයට ඇත්තේ එකම මූලාශ්‍ර ඇතිනිසා බවද තේරුම් ගතයුතුය.

## සද්ධර්ම ප්‍රතිරූපක අනෙක් අන්තය

### විඥ්ඥාණවාදය

විදර්ශනා භාවනාව කරන්නේ කෙසේදැයි මෙකල බොහෝ දෙනෙකුට ඇති ගැටළුවකි. එය පදනමක් ලෙස තවදුරටත් විදර්ශනා ප්‍රතිරූපක මිථ්‍යා මතවාද හැඳින ගතයුතුය.

සියලු දෙය සිතින් මවාගත් දේ ලෙස දැක්වීම විඥ්ඥාණවාදයයි. රූප යනු සිතේ පරිකල්පනයක් බව විඥ්ඥාණවාදීන්ගේ අදහසයි. මේ නිසා අනන්‍ය වූ නාම - රූප ධර්මයන් ගැන සඳහන් වන විස්තරවන අභිධර්ම පිටකය විඥ්ඥාණවාදීන් බොහෝ විට රුචි නොකළහ. බුද්ධකාලයෙන් ශතවර්ශ කිහිපයකට පසු මෙම අදහස ව්‍යාප්ත විය. මහායානිකයන් අතර විශේෂයෙන් විඥ්ඥාණවාදී අදහස් බහුලය. ලාංකීය විද්වතුන් අතරද මෑතක සිට තරමක් ව්‍යාප්ත වී ඇති බව දක්නට ලැබුණි. එහි ආකාර කිහිපයකි.

1. රූපය යනු සිතින් මවාගත් දෙයකි. සත්‍ය වශයෙන් නැත.

2. සත්‍යය අවබෝධය ලැබූවිට එසේ නැත්නම් ඥාණදර්ශනය පහළවූවිට රූප අහෝසි වේ.

3. ඇස කන ආදි රූප සිත සමග පහළවී සිත සමග බිඳී යයි.

4. මව, පියා, .. බුදු හිමියන් හඳුනාගන්නා සංඥා පරිකල්පනයන් පමණය.

## රූපය යනු සිතින් මවාගත් දෙයක්ද. සත්‍ය වශයෙන් නැත්ද?

මේසයක් පුටුවක් කෝප්පයක් වැනි බාහිර පරිසරයේ වස්තුවක් පෙන්නා ඒවා සිත තුල තිබෙන බව විඥ්ඥාණවාදීන් කියයි. එසේත් නැත්නම් සිතේ පරිකල්පනයක් පමණක් බව අසන්නට ලැබේ. සතරමහා භූතයන් යනු සංකල්පයක් යැයි සමහරවිට අසන්නට ලැබේ. සිහිනයකදී දකින දේවල් සැබෑවට නැතුවාක් මෙන් සාමාන්‍ය ජීවිතයේ අත්දකින දේද බොරුවක් හෝ මුළාවක්ලෙස විඥ්ඥාණවාදයට හසුවූවෝ පවසති. දැනෙන සියළු දේ බොරුවක් යැයි විටෙක පවසත්. ඔවුනට අනුව වයස්ගතවීම මරණය සිතේ පරිකල්පනයන්ය.

බුදුරජාණන්වහන්සේ ස්කන්ධ පහක් අර්ථදැක්වූසේක. එයින් එකක් රූපස්කන්ධයයි. සතරමහාභූතයෝත් උපාදාය රූපත් ලෙසින් රූපය අර්ථදැක්වූසේක. පඨවි, ආපෝ, තේජෝ, වායෝ සතර මහාභූත ලෙසත් ඒවා ඇසුරු කොට ඒවා මත පිහිටා හටගන්නා අනෙකුත් රූපාකාර උපාදායරූප ලෙසිනි. ඇස, කන, දිව, ශබ්දය, ගන්ධය ආදිය උපාදාය රූපයන්ට උදාහරණයි. තවද ඒ ඒ රූපයන්ගේ වෙනස්කම් ඇතිබව තේරුම් ගතයුතුය. ඇසෙන් කරන කාර්යය කනෙන් කළ නොහැක. කනෙන් කරන කාර්යය දිවෙන් කළ නොහැක.

උපාදානයට ලක්වන ස්කන්ධපස චතුරාර්යසත්‍යය දේශනාවේදි දුක්ඛසත්‍යය ලෙස අර්ථදැක්වේ. යමක් සත්‍යය නම් එය සැබෑවක් විය යුතුය. රූප වේදනා ආදි පංචස්කන්ධ ධර්මයන් දුකක් සේම සත්‍යයකි. අතීතයේ එම ධර්මයන් හටගත් බව සැබෑය. අනාගතයේ හටගන්නා බව සැබෑය. වර්තමනයේ හටගෙන ඇතිබව සැබෑය. රූපයක් සැබෑවට නැත්නම් ස්කන්ධපහක් නොව සතරක් ගැන සඳහන් කළානම් ප්‍රමාණවත්ය.

විඥ්ඥානය විටෙක මායාකාරීය. විටෙක නැති දේ ඇති සැටියට පෙන්වයි. පෙර විපල්ලාස සතර ආකාරයක් දැක්වුණි.

අනිත්‍ය වූ දෙයෙහි නිත්‍ය යැයිද දුක්වූ දෙයෙහි සැප යැයිද අනාත්ම දෙයෙහි ආත්ම යැයිද අසුභ දෙයෙහි සුභ යැයිද විඤ්ඤානයේ මායාවන්ය. සැබෑවට නොවූ සිද්ධීන් සිදුවූවා ලෙස සමහරුන්ගේ මතකයෙහි රැඳී ඇත. නමුත් මෙවන් අවස්ථා හේතුකොට සියළු දේම බොරුවක් යැයි කීම කරුණු නොසලකා හැරීමකි.

බාහිර පරිසරයේ යම් වස්තූන් ගැන අවධානය යොමු කරනවිට ඒවාගැන වඩාත් දැනුවත් බාවයක් ඇතිවේ. එය හොඳින් ස්පර්ශවනවිටද දැනුවත්බව වර්ධනය වේ. එම ස්පර්ශයත් දැනුවත් බවත් සමගම වින්දනයක් හටගනී. මෙතැනදී මතුවන්නේ මානසික ධර්ම අතර සම්බන්ධයයි. එනම් අවධානය සමග විඤ්ඤානයත් ස්පර්ශ සමග විඤ්ඤානයත් වැනි එක්ව හටගන්නා ධර්ම අතර සම්බන්ධයයි.

මෙවන් අවස්ථා විග්‍රහ කිරීමට ගොස් බොහෝවිට විඤ්ඤානවාදයට හසුවූවන් අරමුණු වූ රූපය විඤ්ඤානය නිසා පවතින බවක් කියයි. ඇත්තෙනම කිවයුතු වනනේ රූපාරම්මණය ඔස්සේ විඤ්ඤානය හටගත් බවක් මිස විඤ්ඤානය නිසා අරමුණු වූ රූපය පවතින බවක් නොවේ. බුදුහිමියන් විසින් ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤානය හටගන්නා බවමුත් ඇසත්, චක්ඛුවිඤ්ඤානයත් නිසා රූප හටගන්නා බවක් නම් දේශනා කොටනැත.

සංයුක්ත නිකායේ ධාතුසංයුක්තයේ මෙසේ සඳහන් වේ.

''කථඤ්ච,භික්ඛවේ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, නෝ ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තං? චක්ඛුධාතුං, භික්ඛවේ, පටිච්ච උප්පජ්ජති චක්ඛුසම්ඵස්සෝ, නෝ චක්ඛුසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති චක්ඛුධාතු ..පෙ... මනෝධාතුං පටිච්ච උප්පජ්ජති මනෝසම්ඵස්සෝ, නෝ මනෝසම්ඵස්සං පටිච්ච උප්පජ්ජති මනෝධාතු. ඒවං බෝ, භික්ඛවේ, ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, නෝ ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති ධාතුනානත්තන්ති ''

(කෙලෙසද මහණෙනි ධාතුනානත්වය නිසා ස්පර්ශනානත්වය හටගනුයේත් ස්පර්ශනානත්වය නිසා ධාතුනානත්වය නොවන්නේ?

මහණෙනි, චක්ඛුධාතු නිසා චක්ඛුසම්පර්ශය උපදියි. චක්ඛුසම්පර්ශය නිසා චක්ඛුධාතු නොවේ, ..පෙ.... මනොධාතු නිසා මනෝසම්පර්ශය උපදියි මනෝසම්පර්ශය නිසා මනෝධාතු නොවේ. මෙලෙසින් මහණෙනි, ධාතුනානත්වය නිසා ස්පර්ශනානත්වය හටගනී ස්පර්ශනානත්වය නිසා ධාතුනානත්වය නොවේ. )

## සත්‍යයාවබෝධය ලැබූවිට නැත්නම් ඥානදර්ශනය පහළවූවිට රූප අහෝසි වේද?

අන්ධ හෝ බිහිරි පුදගලයෙකුත් සාමාන්‍ය පුද්ගලයෙකු අතරත් වෙනස කුමක්දැයි කල්පනා කිරීමෙන් ඇස කන ආදි නොයෙකුත් රූපාකාර සිතේ මැවීමක්ද නැත්ද යන්න වටහා ගතහැක. ඥානදර්ශනය පහළවූවිට රූප අහෝසි වෙත්නම් රහත් වූවිට ඇස්පෙනීම නැතිවනු ඇත. මෙසේ ඇතිවිට අන්ධ පුද්ගලයා ඇස්පෙනීම ලබාගැනීමට කළයුතු වන්නේ අවිද්‍යාව වැඩිකරගැනීමයි.

මෙලෙස රූපාකාර සිතේ පරිකල්පනයක් යැයි කියන විඤ්ඤානවාදීන්ගෙන් ඇසිය යුත්තේ එම පරිකල්පනයද පරිකල්පනයක් වන්නේද යන්නයි. ඔවුන් බොහෝවිට සියල්ලම සිතේ මැවීමක් යයි කියන බැවිනි. මෙය තේරුම් ගනීමට සාක්ෂිකරුවන් තිදෙනෙක් ඇති මිනීමැරුම් නඩුවක් ගැන සිතමු. පළමු සාක්ෂිකරු මිනීමැරුම දුටු බව ස්ථිරවම පවසයි. දෙවැන්නා පළමු සාක්ෂිකරු පවසන්නේ බොරු බව කියයි. තෙවැන්නා දෙවැනි සාක්ෂිකරු සෑමවිටම බොරු කියන්නෙක් බව දිවුරා කියයි. තෙවැනි සාක්කිය පිළිගන්නේ නම් මිනීමැරුම දැක්කා යයි කියන සාක්කිය බලවත් වේ. මිනීමැරුම දැක්කා යනු රූපයක් අරමුණුකොට සිතක් හටගත්තා වැනිය. එම සිතේ හැඟීම බොරු යැයි කීම දෙවැනි සාක්ෂිකරු මෙන්ය. එසේ බොරුවක් යැයි කීමට පාදක වූ සිතද මුලාවූවක් යැයි පැවසීම තුන්වන සාක්ෂිකරු මෙන්ය. මෙලෙස විඤ්ඤානවාදයට හසුවූවෙකුට සිදුවනුයේ ඇත්ත සහ බොරුව ගැන පඹගාලක පැටලීමටය.

විඤ්ඤාණවාදීන්ට මේ නිසා බොහොවිට ශරීරය අමතක වේ. කායානුපස්සනාව මගහැරී යයි. රූපය පිළිබඳ අනිත්‍ය සංඥාව මනාව ඉස්මතු කරගැනීමට ඔවුන් අසමත් වෙත්. වයස්ගත සිරුරක ස්වභාවය තරුණ කාලයට වඩා වෙනස් බව නොතේරෙයි. අනාගතයේ ඇති සැබෑ අවධානම මගහැරී යයි. සිතේ ගැඹුරු අන්තර් සම්බනධතා ගැන පමණක් බොහෝවිට ඔවුන්ගෙන් අසන්නට ලැබේ. කයේ දුක්සහගත ස්වභාවය සතර අපාය ඔවුන්ට මගහැරී යයි. අවසානයේ සැබෑවිදර්ශනාව මගහැරී යයි.

## ඇස, කන ආදි රූප සිත සමග පහළවී සිත සමග බිඳී යයිද?

ඇස, කන මෙන් නොවේ. කන, දිව මෙන් නොවේ. මිනිසෙකුගේ ඇස  තිරිසනකුගේ ඇස මෙන් නොවේ. සමහර තිරිසනුන්ට අවට පෙනෙනුයේ කළු සුදු ලෙසය. මිනිසෙකුකට මෙන් එක් බැල්මෙන්ම අවට පිහිටි වස්තූන්, ඒවා අතර පරතරයන්, වස්තූන්ගේ විවිධත්වය තිරිසනාට නොදැනේ. ඇසේ විවිධත්වය වෙසෙසින්ම මේ සඳහා බලපායි. විවිධ වර්ණපරාසයන් සිතටග්‍රහනය  කරදීමේ හැකියාව ඇසමත තීරණය වේ. මේනිසා චක්ඛුවිඤ්ඤානය හෝ චක්ඛුසම්පර්ශය ඇස මත රඳා පවතී. චක්ඛුවිඤ්ඤානයේ වෙනස්කම් නිසා ඇසේ වෙනසකම් හටනොග නී. ඉහත උධෘත සූත්‍රයෙන්ද පෙන්නුම් කරන්නේ එයයි.

ලේමස් වල උපකාරයෙනුත් ඇසේ පැවැත්මට සුදුසු ප්‍රශස්ත උෂ්ණයකුත් පීඩනයකුත් කරන කොටය. ඇත්තෙන්ම ඇස පවතිනුයේ. පෙර කරන ලද කර්මයද ඇසේ හටගැනීමට දායක වේ. කෙටියෙන් කිවහොත් සතරමහාභූතත් කර්ම ශක්තියත් නිසාය ඇස උපදිනුයේ. ඇස පුරාණයේ කරන ලද කර්මය සමග සම්බන්ධ බවට බුද්ධ වචනය පහත අයුරිනි.

**සංයුත්තනිකාය -කම්මනිරොධසුත්තං**

**"කතමඤ්ච, භික්ඛවේ, පුරාණකම්මං? චක්ඛුං භික්ඛවේ, පුරාණකම්මං අභිසඞ්ඛතං අභිසඤ්චේතයිතං වේදනියං දට්ඨබ්බං ..පෙ.. ජිව්හා ..පෙ.. පුරාණකම්මා අභිසඞ්ඛතා ..'**

නමුත් ඇස පිළිබඳ අප දැනුවත් වනුයේ චක්ඛුවිඤ්ඤානය ඔස්සේය. උදෑසන අවධිවනවිට අවට වස්තූන් බොඳවී පෙනුනොත් හෝ වයස්ගතවනවිට අවට නොපෙනීයනවිට තම අවධානය යොමු වන්නේ ඇස කෙරෙහිය. පරිසරයේ වස්තූන්හි දොෂයක් නොව ඇසෙහි ප්‍රශ්නයක් ඇතිබව වැටහීයයි. මෙවිට අරමුණ වූයේ ඇසයි. හියවූයේ ඇසගැනයි. මෙය මනෝවිඤ්ඤානය අවස්ථාවයි. ඇසේ ස්වභාවය ගැන දැනුවත් වූයේ ඇසපාදකව හටගත්තාවූ දැනුවත්කම් සැසඳීමෙනි. මේ නිසා ඇස ගැන දැනුවත්වීමට උපකාරීවූ සාධක ඇස සකස් වීමට හේතුවූ සාධක නොවන බව පාඨකයාට පැහැදිලි ඇතයි සිතමි.

මෙම වෙනස වටහා නොගැනීම නිසා සමහරෙක් චක්ඛුවිඤ්ඤානය සමගම ඇස හටගනී යන වැරදිමතයක එල්බ ගත්තේය. ඇසේ අනිත්‍යතාවය පැහැදිලි කිරීමේ පහසු ක්‍රමයක් ලෙසද මෙම සාවද්‍ය මතය භාවිතා වේ. එනම් පෙනීම පවතින විට ඇස පැනවෙන බවත් පෙනීම නැතිවී යනවිට ඇසනැතිවන බවත් ලෙසිනි. මෙලෙසම කන නාසය, දිව, කය, මන, අනෙකුත් ඉන්ද්‍රියන්ගේද අනිත්‍යතාවය සාවද්‍ය ක්‍රමයක් ඔස්සේ පැහැදිලි කෙරෙන බව පෙනෙන්නට තිබේ. මෙලෙස විඤ්ඤානය සමගම රූප හටගන්නා බවත් එය සමගම බිඳී යන බවටත් වැරදි මතයක් ගොඩනැගුනි. සියලු ධර්මයෝ එක්සිතක් පවතින කාලයක් පමණක් පවතින බවට සදොස් මතයක් ගොඩනැගුනි. මෙවන් මිථ්‍යාමතයක් තුන්වන ධර්මසංගායනාවට පෙරාතුවත් තිබූ බව කථාවස්තුප්‍රකරණයේ එන ඛණිකකථාවෙන් පෙනේ.

**අභිධම්මපිටකෙ - කථාවත්ථුපාළි-ඛණිකකථා**

**906. ඒකචිත්තක්ඛණිකා සබ්බේ ධම්මාති? ආමන්තා. චිත්තේ මහාපඨවී සණ්ඨාති, මහාසමුද්දො සණ්ඨාති, සිනේරුපබ්බතරාජා සණ්ඨාති, ආපෝ සණ්ඨාති, තේජෝ සණ්ඨාති, වායෝ සණ්ඨාති, තිණකට්ඨවනප්පතයෝ සණ්ඨහන්තීති? න හේවං වත්තබ්බේ ..පෙ..**

මෙහිදී මොග්ගලීපුත්තතිස්ස තෙරුන්වහන්සේ සියලු ධර්මයෝ එක්චිත්තක්ෂනයක් පමණක් පවත්නේදැයි ප්‍රශ්ණ කොට එසේ වන්නේ නම් මහපොළොව මහා සමුද්‍රය සිනේරු පර්වතය ආදි රූපමය දේවල් සිතේ පිහිටා ඇත්දැයි ප්‍රශ්ණ කරයි. පරවාදීන්ගේ අදහස වූයේ සිතට අරමුණු වන දේ සිත සමග බිඳී යායුතු බවයි. සිතත් සමඟ බිඳී යාමට නම් සිත සමග සම්ප්‍රයුක්ත විය යතු නොවේදැයි ඒත්තු ගැන්වීමට මෙසේ ප්‍රශ්ණ කරයි. එම ප්‍රශ්නයට අදාළව දෙවැනි වර සූත්‍ර දේශනාවක් උපුටා දක්වන තෙරුන් වහන්සේ කාරණය වඩාත් පැහැදිලි කරදෙයි

''ඒකචිත්තක්ඛණිකා සබ්බේ ධම්මාති? ආමන්තා .. චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණේන සහජාතන්ති? ආමන්තා. නනු ආයස්මා සාරිපුත්තෝ ඒතදවෝච - අජ්ඣත්තිකඤ්චේව, ආවුසෝ, චක්ඛුං අපරිභින්නං හොති, බාහිරා ච රූපා න ආපාථං ආගච්ඡන්ති, නෝ ච තජ්ජෝ සමන්නාහාරෝ හෝති, නේව තාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවෝ හෝති. අජ්ඣත්තිකඤ්චේව, ආවුසෝ, චක්ඛුං අපරිභින්නං හොති, බාහිරා ච රූපා ආපාථං ආගච්ඡන්ති, නෝ ච තජ්ජෝ සමන්නාහාරෝ හෝති, නේව තාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවෝ හෝති. යතෝ ච ඛෝ, ආවුසෝ, අජ්ඣත්තිකඤ්චේව චක්ඛුං අපරිභින්නං හෝති, බාහිරා ච රූපා ආපාථං ආගච්ඡන්ති, තජ්ජෝ ච සමන්නාහාරෝ හෝති, ඒවං තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවෝ හෝතීති '' (ම. නි. 1.306)

අත්ථේව සුත්තන්තෝති? ආමන්තා. තේන හි න වත්තබ්බං - චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණේන සහජාතන්ති. ''

(සියලු ධර්මයෝ එක්චිත්තක්ෂණයක් පමණක් පවත්නේදැයි? එසේය (පරවාදයට අනූව)

ඇස නැමැති ආයතනය චක්ඛුවිඤ්ඤාණය සමග එක්ව හටගනීද? එසේය (පරවාදයට අනූව)

සාරිපුත්තයන් වහන්සේ මෙසේ කියා තිබෙනවා නේද - " ඇවැත්නි, අධ්‍යාත්මික ඇස බිඳී නැතිවිට, බාහිර රූපත් අභිමුඛයට නොපැමිනෙත්ද, අදාළ වූ මනසිකාරයත් නොවේද, ඒතාක් අනුරූප වූ විඤ්ඤාණයේ පහළවීම නොවේ. ඇවැත්නි, අධ්‍යාත්මික ඇසද බිඳී නැතිවිට, බාහිර රූපත් අභිමුඛයට පැමිනෙත්ද, අදාළ වූ මනසිකාරයත් නොවේද, ඒතාක් අනුරූප වූ විඤ්ඤාණයේ පහළවීම නොවේ. ඇවැත්නි, අධ්‍යාත්මික ඇස බිඳී නැතිවිට, බාහිර රූපත් අභිමුඛයට පැමිනෙත්ද, අදාළ වූ මනසිකාරයත් වේද, එලෙසින් අනුරූපවූ විඤ්ඤාණයේ පහළවීම වෙති " යැයි සූත්‍රයක් ඇත්තේ නොවේද? එසේය. එහෙමනම් ඇස, චක්ඛුවිඤ්ඤාණය සමග එක්ව හටගනී යැයි නොකිය යුතුමය. )

චක්ඛුවිඤ්ඤාණය නැතිවිට ඇස පැවතුනු බවට ඉහත පාඨවලින් ගම්‍යවේ. අභිධර්මයට අනූව නම් මෙහි කිවයුත්තක් නැත. ඇස කන ආදි පංච ඉන්ද්‍රියන් පෙර ජාතව පසුව ජනිත වන චක්ඛුවිඤ්ඤාණය, සෝතවිඤ්ඤාණ ආදියට හේතුවන බව පැහැදිලිව දක්වා ඇති බැවිනි. පාලි පාඨය මෙලෙසය.

**''පුරේජාතපච්චයෝ - චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ. සෝතායතනං සෝතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ. ඝානායතනං ..පෙ..''**

අභිධම්මපිටකය - පට්ඨානපාළි

<u>මව, පියා, .. බුදු හිමියන් හඳුනාගන්නා සංඥා පරිකල්පනයන් පමණද?.</u>

එකම දෙයක් කෙරෙහි විවිධ පුද්ගලයන්ට විවිධ හැඟීම් පහළ වේ. ඒ ඒ අය ලබා ඇති අත්දැකීම් අනූව මතකය අනූවද යමක් හෝ යම් පුද්ගලයෙක් මුනගැසුනවිට පහළ වන හැඟීම් විවිධ වේ. එය අතීත හේතුන්ට අනූව වර්තමාන ඵල සකස් වීමකි. එකම පුද්ගලයා කෙරෙහි කෙනෙක් තම ගුරුවරයා ලෙස

හඳුනාගනී. තව කෙනෙක් තම පුත්‍රයා ලෙස හඳුනාගනී. තව කෙනෙක් තම ස්වාමිපුරුෂයා ලෙස ලෙස හඳුනාගනී. එකම ලේ මස් ගොඩක් විවිධ අයුරින් හඳුනාගැනීම සදොස් නොවේද? මෙම විවිධ හැඟීම් වැරදියි නොවේද?

මෙලෙස විචාර කිරීම පුද්ගල සංඥාවෙන් මිදීමට පිටිවහලක් මෙන් පෙනුනද මෙහි සියුම් දෝෂයක් නැත්තේද නොවේ. මෙසේ ඇතිවිට භික්ෂුවක් තම ආචර්යවරයා හඳුනාගැනීම වැරදිද? අතීතයේ රහතන් වහන්සේලා බුදුහිමියන් දකිනවිට හඳුනාගෙන ගරුබුහුමන් නොකලේද? තවද " **අත්ථි මාතා අත්ථි පිතා....**" මව ඇත පියා ඇත ලෙස ලෝකිය සම්මාදිට්ඨියක් ගැන බුදුහිමියන් වදාළා නොවේද?

මෙතැනදී නැවතත් මතුවනුයේ කුසලය කුමක්ද අකුසලය කුමක්ද යන ප්‍රශ්නයයි. ප්‍රහානය කළයුතු දේ කුමක්ද පිරිසිඳ දැකිය යුත්ත කුමක්ද යන ගැටළුවයි. ප්‍රහානය වියයුත්තේ විපල්ලාස විනා සැම සංඥාවක්ම නොවේ. අනෙකුත් කුසල අබ්‍යාකත සංඥා හටගන්නා ආකාරය එයට පදනම් වූ අතීත අත්දැකීම් සම්භාරය වටහාගතයුතුය. එම කුසල අබ්‍යාකත සංඥා හටගැනීමට වර්තමාන උපකාරක ධර්මයන් වූ ඇස කන රූප සද්ද ආදිය ගැනද වටහා ගතයුතුය. මෙසේ හේතූන් නිසා ඵල හටගන්නා බවත් හේතු නිරෝධයෙන් ඵල නිරුද්ධ වන බවත් තේරුම් ගතයුතුය. මෙලෙසින් පිරිසිඳ දතයුතු ධර්මයන්ද අනිත්‍ය බවත්, අනිත්‍ය සංඥාව ඔස්සේ ඒවායේ දුක්ඛ අනාත්ම ලක්ෂණත් අවබෝධ කරගත යුතුය.

## අවසාන වශයෙන්

නාම-රූප ක්‍රියාකාරිත්වය ඉතා ගැඹුරුය. ගැඹුරු ලෙස දිස්වන්නක්ද වේ. එනමුත් ධර්මයේ නාමෙයන් අනවශ්‍ය සංකීර්ණතාවල එල්බ ගැනීමද අපවිසින් සිදුනොකළ යුතුය. දහමේ ගැඹුරු බව නිසාම නොයෙකුත් පටලවාගැනීම් සිදුවීම වැළැක්විය නොහැක. සාවද්‍ය මතවාද කෙරෙහි එක්තරා මට්ටමක උපේක්ෂාවක්ද අවශ්‍යය. ගරුකටයුතු ස්වාමීන් වහන්සේලා අතින්ද

වැරදීම් සිදුවිය හැක. එමනිසා නුවණින් යුතුව මෙම කෘතියේ කරුණු විමර්ෂනයට ලක්කිරීම පාඨකයාට බාරය.

බුද්ධකාලයේදිත් නොයෙකුක් මතවාද ඉදිරිපත් වූවිට බුදුරජාණන් වහන්සේත් මහාශ්‍රාවකයන් වහන්සේලාත් බොහෝවිට අනුගමනය කළ ක්‍රමයක්ද ඇත. එනම් ක්‍රමානුකූලව අනිත්‍ය සංඥාව මතුකර දීමයි. ජීවයත් ශරීරයත් එකක්ද නැතිනම් ජීවය අනෙකක් ශරීරය අනෙකක්ද යනාදි අබ්‍යාකත ප්‍රශ්ණ හමුවේ පංචස්කන්ධයේ අනිත්‍යතාවය ප්‍රකට වනසේ දහම් මනසිකාරයකට යොමුකරවීමයි. දහම් මනසිකාරය අවසන වැරදි දෘෂ්ටීන් බිඳවැටුණි.

අවසාන වසයෙන් පාඨකයන්ට දෙන උපදේශය වනුයේ

- සරලව සතිපට්ඨානයට අනුකූලව සිහි කැඳවීම් කරන ලෙසය.
- එයට අනූවම අනිත්‍ය සංඥාව ගොඩනගන ලෙසය.
- හැකිතාක් ත්‍රිපිටකගත ධර්මය හදාරන ලෙසත්.
- යමක් ධර්මය ලෙස, ධර්මමාර්ගය ලෙස නිතර ඇසේ නම් එය ත්‍රිපිටකය තුළ සඳහන් වන්නේ දැයි පිරික්සා බලන ලෙසත්ය.

තෙරුවන් සරණයි!

# පිං පැමිණවීම

මෙම ධර්ම දානමය කුසලයට සම්බන්ධ වූ පිංවතුන්,

ක්‍රිෂාන්ති සේනාරත්න මැතිණිය, සම්පත් මැදගෙදර මහතා සහ කුසුමා ජයවර්ධන මැතිණිය විසින් **විමලසේන සේනාරත්න** මහතාට සහ **සුමනසේන මැදගෙදර** මහතාට පිං පිණිස - රු. 30,000/=

අමිල තේජක මහතා - රු. 20,000/=

චතුර වික්‍රමරත්න මහතා - රු. 20,000/=

චතුර ද සිල්වා මහතා විසින් **දයාසේන ද සිල්වා** පියතුමාටත්, බිරිඳ වන **සමන්දිකා ද කොස්තා** මැතිණියටත් පිං පිණිස - රු. 15,000/=

කොඩිකාර මහතා විසින් **හර්බට් කොඩිකාර** පියාණන්ට සහ **අයි. එම්. ඩිංගිරිබණ්ඩා** පියාණන් ඇතුලු මියගිය ඥාතීන්ට පිං පිණිස - රු. 15,000/=

විනෝද් කොතලාවල මහතා සහ තුෂාර කොතලාවල මහතා විසින් **ලියෝනි කොතලාවල** හා **තිස්ස කොතලාවල** යන දෙමව්පියන්ට පිං පිණිස - රු. 10,000/=

පතිරාජ පවුලේ අය විසින් - රු. 10,000/=

මහේන්ද්‍ර අමුණුගම මහතා - රු. 5,000/=

ලසිත මලලසේකර මහතා - රු. 5,000/=

ජයන්තා පද්මසීලි මැතිණිය - රු. 5,000/=

නව මුද්‍රණයේ සංශෝධනයන්ට පරිඝනක උපාංග ලබා දීමෙන් සහය වූ **මහේන්ද්‍ර අමුණුගම** මහතාටත්, සෝදුපත් බැලීමෙන් සහය වූ **චතුර ද සිල්වා** මහතාටත් විශේෂ ස්තූතිය පිරිනමමි.

මේ ධර්ම දානයේ පිනෙන් සියලු දෙනාගේත් සම්‍යක් ප්‍රාර්ථනා සඵල වේවා! උතුම් ඥාණ දර්ශනය පිණිසම වේවා! නිවන් පිණිසම මෙම පින හේතු වේවා!

**බෙල්ලන්විල ධම්මානන්ද හිමි**
2024.03.29